# වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2023

## පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

<u>පරිච්ඡේදය - 01</u>

### 1.1 ආයතනය හැඳින්වීම

2023 වර්ෂයේදී පළාත් සභාව මඟින් විවිධ මූලාශ්‍රයන්ගෙන් ලද ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් උතුරු මැද පළාත් අධ්‍යාපනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනය උදෙසා ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කරන ලදී. උතුරු මැද පළාතේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවත් ඒ යටතේ ක්‍රියාත්මක කලාප අධ්‍යාපන කාර්යාල සහ කොට්ඨාස අධ්‍යාපන කාර්යාල සහ සමස්ථ පාසල් පද්ධතියේ භෞතික හා මානව සම්පත් සංවර්ධනය මඟින් ගුණාත්මක අධ්‍යාපනයක් කරා උතුරු මැද පළාත ගෙනයාම මුඛ්‍ය පරමාර්ථය විය.

උතුරින් උතුරු පළාතටත්, නැගෙනහිරින් නැගෙනහිර පළාතටත්, බටහිරින් වයඹ පළාතටත්, දකුණින් මධ්‍යම පළාතටත් මායිම් වන රජරට නුවරකළාවිය හෙවත් වැව්බැඳි රාජධානිය ලෙස විරුධාවලිය ලද උතුරු මැද පළාත පරිපාලන දිස්ත්‍රික්ක දෙකකින් සමන්විත වේ.



මෙලෙස පරිපාලන දිස්ත්‍රික්ක දෙකකින් සමන්විත උතුරු මැද පළාත අධ්‍යාපන කලාප 08 කින් යුක්ත වේ. අනුරාධපුර, කැකිරාව, තඹුත්තේගම, ගලෙන්බිඳුණුවැව හා කැබිතිගොල්ලෑව යන අධ්‍යාපන කලාප 05 අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් අතර පොළොන්නරුව, හිඟුරක්ගොඩ හා දිඹුලාගල යන අධ්‍යාපන කලාප 03 පොළොන්නරුව දිස්ත්‍රික්කයට අයත් වේ.

## අධ්‍යාපන කලාප පිහිටීම - උතුරු මැද පළාත




## අධ්‍යාපන කොට්ඨාස පිහිටීම - උතුරු මැද පළාත




මෙම කලාප අධ්‍යාපන කාර්යාල 08 යටතේ අධ්‍යාපන කොට්ඨාස තිහක් පාලනය වන අතර, උතුරු මැද පළාතට අයත් අධ්‍යාපන කලාප 08 හා අධ්‍යාපන කොට්ඨාස 30 සහ පාසල් 810 හි ව්‍යාප්තිය පහත වගුව පරිදි දැක්වේ.

# කලාප හා කොට්ඨාස අනුව පාසල් සංඛ්‍යාව - 2023
# (2023.12.31 දිනට)

**අනුරාධපුර දිස්ත්‍රික්කය**

| අනු අංකය | කලාපය | කොට්ඨාසය | පාසල් සංඛ්‍යාව |
|---|---|---|---|
| **01.** | අනුරාධපුර | නැ.නු.ප | 22 |
| | | ම.නු.ප | 32 |
| | | රඹෑව | 31 |
| | | නොච්චියාගම | 24 |
| | | මහවිලච්චිය | 16 |
| | | නාච්චාදූව | 11 |
| | | **එකතුව** | **136** |
| **02.** | කැකිරාව | කැකිරාව | 44 |
| | | පලුගස්වැව | 15 |
| | | පලාගල | 24 |
| | | ඉපලෝගම | 22 |
| | | තිරප්පනේ | 25 |
| | | **එකතුව** | **130** |
| **03.** | තඹුත්තේගම | තලාව | 30 |
| | | තඹුත්තේගම | 15 |
| | | රාජාංගනය | 11 |
| | | ගල්නෑව | 16 |
| | | **එකතුව** | **72** |
| **04.** | ගලෙන්බිඳුණුවැව | කහටගස්දිගිලිය | 39 |
| | | ගලෙන්බිඳුණුවැව | 37 |
| | | මිහින්තලේ | 19 |
| | | **එකතුව** | **95** |
| **05.** | කැබිතිගොල්ලෑව | කැබිතිගොල්ලෑව | 25 |
| | | පදවිය | 18 |
| | | මැදවච්චිය | 41 |
| | | හොරොව්පොතාන | 41 |
| | | **එකතුව** | **125** |
| | **අනුරාධපුර දිස්ත්‍රික්කය** | | **558** |

**පොලොන්නරුව දිස්ත්‍රික්කය**

| අනු අංකය | කලාපය | කොට්ඨාසය | පාසල් සංඛ්‍යාව |
|---|---|---|---|
| 06. | පොලොන්නරුව | තමන්කඩුව | 32 |
| | | ලංකාපුර | 21 |
| | **එකතුව** | | **53** |
| 07. | හිඟුරක්ගොඩ | හිඟුරක්ගොඩ | 33 |
| | | මැදිරිගිරිය | 35 |
| | | ඇළහැර | 28 |
| | **එකතුව** | | **96** |
| 08. | දිඹුලාගල | දිඹුලාගල | 31 |
| | | අරලංගවිල | 31 |
| | | වැලිකන්ද | 41 |
| | **එකතුව** | | **103** |
| | **පොලොන්නරුව දිස්ත්‍රික්කය** | | **252** |

**උතුරු මැද පළාත 810**

## කොට්ඨාස සහ පාසල් සංඛ්‍යාව අධ්‍යාපන කලාප අනුව - 2023
## (2023.12.31 දිනට)

| දිස්ත්‍රික්කය | කලාපය | කොට්ඨාස සංඛ්‍යාව | මුළු පාසල් සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|
| | | | ජාතික පාසල් සංඛ්‍යාව | පළාත් සභා පාසල් සංඛ්‍යාව | එකතුව |
| අනුරාධපුර | අනුරාධපුරය | 6 | 3 | 133 | 136 |
| | තඹුත්තේගම | 4 | 2 | 70 | 72 |
| | කැකිරාව | 5 | 2 | 128 | 130 |
| | ගලෙන්බිඳුණුවැව | 3 | 0 | 95 | 95 |
| | කැබිතිගොල්ලෑව | 4 | 1 | 124 | 125 |
| **අනුරාධපුර දිස්ත්‍රික්කය** | | **22** | **8** | **550** | **558** |
| පොළොන්නරුව | පොළොන්නරුව | 2 | 3 | 50 | 53 |
| | හිඟුරක්ගොඩ | 3 | 5 | 91 | 96 |
| | දිඹුලාගල | 3 | 1 | 102 | 103 |
| **පොළොන්නරුව දිස්ත්‍රික්කය** | | **8** | **9** | **243** | **252** |
| **උතුරු මැද පළාත** | | **30** | **17** | **793** | **810** |



## පාසල් වර්ගීකරණය අනුව පාසල් සංඛ්‍යාව - 2023
## (2023.12.31 දිනට)

| කලාපය | 1 AB | 1 C | Type 2 | Type 3 | එකතුව |
|---|---|---|---|---|---|
| අනුරාධපුර | 12 | 31 | 43 | 50 | 136 |
| තඹුත්තේගම | 8 | 11 | 26 | 27 | 72 |
| කැකිරාව | 9 | 31 | 25 | 65 | 130 |
| ගලෙන්බිඳුණුවැව | 4 | 18 | 25 | 48 | 95 |
| කැබිතිගොල්ලෑව | 6 | 12 | 42 | 65 | 125 |
| **අනුරාධපුර දිස්ත්‍රික්කය** | **39** | **103** | **161** | **255** | **558** |
| පොළොන්නරුව | 9 | 11 | 12 | 21 | 53 |
| හිඟුරක්ගොඩ | 9 | 9 | 26 | 52 | 96 |
| දිඹුලාගල | 7 | 17 | 15 | 64 | 103 |
| **පොළොන්නරුව දිස්ත්‍රික්කය** | **25** | **37** | **53** | **137** | **252** |
| **උතුරු මැද පළාත** | **64** | **140** | **214** | **392** | **810** |

- ✓ 1AB- අ.පො.ස. (උ.පෙළ) විද්‍යා විෂය ධාරාව සහිත පාසල්
- ✓ 1C- අ.පො.ස. (උ.පෙළ) පවතින නමුත් විද්‍යා විෂය ධාරාව නොමැති පාසල්
- ✓ Type 2- පළමු වන ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා පන්ති පැවැත්වෙන පාසල්
- ✓ Type 3- පළමු වන ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා හෝ 8 ශ්‍රේණිය දක්වා පන්ති පැවැත්වෙන පාසල්

# උතුරු මැද පළාත - ජාතික පාසල් ලේඛනය 2023

| අනු අංකය | කලාපය | සංගණන අංකය | පාසලේ නම | පාසල් වර්ගය | පංති පරාසය |
|---|---|---|---|---|---|
| 1 | අනුරාධපුර | 19176 | උමැප/අනු/අනු/නැනු/මධ්‍ය විද්‍යාලය | 1ඒබී | 6-13 |
| 2 | | 19177 | උමැප/අනු/අනු/නැනු/ස්වර්ණපාලි බාලිකා ම.වි | 1ඒබී | 1-13 |
| 3 | | 19487 | උමැප/අනු/අනු/නැනු/සහිරා මුස්ලිම් ම.වි | 1ඒබී | 1-13 |
| 4 | තඹුත්තේගම | 19361 | උමැප/අනු/තඹු/තලා/එප්පාවල ශ්‍රී සිද්ධාර්ථ මධ්‍ය මහා විදුහල | 1ඒබී | 6-13 |
| 5 | | 19296 | උමැප/අනු/තඹු/තඹු/ තඹුත්තේගම මධ්‍ය ම.වි | 1ඒබී | 6-13 |
| 6 | කැකිරාව | 19429 | උමැප/අනු/කැකි/කැකි/කැකිරාව ම.ම.වි | 1ඒබී | 6-13 |
| 7 | | 19457 | උමැප/අනු/කැකි/කැකි/ විද්‍යාර්ථ ම.වි | 1ඒබී | 6-13 |
| 8 | කැබිතිගොල්ලෑව | 19001 | උමැප/අනු/කැබි/මැද/මැදවච්චිය ම.ම.වි | 1ඒබී | 6-13 |
| 9 | පොලොන්නරුව | 20069 | උමැප/පො/පො/තමන්/ රාජකීය මධ්‍ය ම.වි | 1ඒබී | 6-13 |
| 10 | | 20073 | උමැප/පො/පො/තමන්/තෝපාවැව මහා විද්‍යාලය | 1ඒබී | 1-13 |
| 11 | | 20154 | උමැප/පො/පො/තමන්/පොළොන්නරුව මු. ම.ම.වි. | 1 AB | 6-13 |
| 12 | හිගුරක්ගොඩ | 20001 | උමැප/පො/හිඟු/හිඟු/ මින්නේරිය ම.වි. | 1 AB | 6-13 |
| 13 | | 20002 | උමැප/පො/හිඟු/හිඟු/ ආනන්ද බාලිකා ම.වි. | 1 AB | 6-13 |
| 14 | | 20176 | උමැප/පො/හිඟු/ඇළ/බකමූණ මහසෙන් ම.වි. | 1AB | 6-13 |
| 15 | | 20035 | උමැප/පො/හිඟු/මැදි/ මැදිරිගිරිය මධ්‍ය ම.වි | 1AB | 6-13 |
| 16 | | 20036 | උමැප/පො/හිඟු/මැදි/දිවුලන්කඩවල ම.ම.වි | 1AB | 6-13 |
| 17 | දිඹුලාගල | 20103 | උමැප/පො/දිඹු/අරල/විලයාය ම.වි | 1AB | 6-13 |

## පාසල් වර්ගීකරණය කලාප හා මාධ්‍ය අනුව - 2023
## (2023.12.31 දිනට)

| කලාපය | සිංහල මාධ්‍ය | | | | එකතුව | දෙමළ මාධ්‍ය | | | | එකතුව | එකතුව | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1 ඒබී | 1 සී | 2 වර්ගය | 3 වර්ගය | | 1 ඒබී | 1 සී | 2 වර්ගය | 3 වර්ගය | | 1 ඒබී | 1 සී | 2 වර්ගය | 3 වර්ගය | |
| අනුරාධපුර | 10 | 27 | 38 | 46 | 121 | 2 | 4 | 5 | 4 | 15 | 12 | 31 | 43 | 50 | 136 |
| තඹුත්තේගම | 8 | 11 | 26 | 27 | 72 | 0 | 0 | 0 | 0 | 0 | 8 | 11 | 26 | 27 | 72 |
| කැකිරාව | 7 | 23 | 16 | 62 | 108 | 2 | 8 | 9 | 3 | 22 | 9 | 31 | 25 | 65 | 130 |
| ගලෙන්බිඳුණුවැව | 3 | 15 | 20 | 44 | 82 | 1 | 3 | 5 | 4 | 13 | 4 | 18 | 25 | 48 | 95 |
| කැබිතිගොල්ලෑව | 6 | 8 | 31 | 62 | 107 | 0 | 4 | 11 | 3 | 18 | 6 | 12 | 42 | 65 | 125 |
| අනුරාධපුර දිස්ත්‍රික්කය | **34** | **84** | **131** | **241** | **490** | **5** | **19** | **30** | **14** | **68** | **39** | **103** | **161** | **255** | **558** |
| පොළොන්නරුව | 7 | 5 | 12 | 17 | 41 | 2 | 6 | 0 | 4 | 12 | 9 | 11 | 12 | 21 | 53 |
| හිඟුරක්ගොඩ | 9 | 8 | 25 | 51 | 93 | 0 | 1 | 1 | 1 | 3 | 9 | 9 | 26 | 52 | 96 |
| දිඹුලාගල | 6 | 14 | 12 | 60 | 92 | 1 | 3 | 3 | 4 | 11 | 7 | 17 | 15 | 64 | 103 |
| පොළොන්නරුව දිස්ත්‍රික්කය | **22** | **27** | **49** | **128** | **226** | **3** | **10** | **4** | **9** | **26** | **25** | **37** | **53** | **137** | **252** |
| උතුරු මැද පළාත | **56** | **111** | **180** | **369** | **716** | **8** | **29** | **34** | **23** | **94** | **64** | **140** | **214** | **392** | **810** |

## ගුරු සංඛ්‍යාව සහ ශිෂ්‍ය සංඛ්‍යාව අධ්‍යාපන කලාප අනුව - 2023



| අධ්‍යාපන කලාපය | පළාත් සභා පාසල් | | ජාතික පාසල් | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | ශිෂ්‍ය සංඛ්‍යාව | ගුරු සංඛ්‍යාව (2023.12.31) දිනට) | ශිෂ්‍ය සංඛ්‍යාව | ගුරු සංඛ්‍යාව (2023.12.31 දිනට) | ශිෂ්‍ය සංඛ්‍යාව | ගුරු සංඛ්‍යා (2023.12.31 දිනට) |
| අනුරාධපුර | 58784 | 3100 | 9242 | 420 | 68026 | 3520 |
| තඹුත්තේගම | 33009 | 1567 | 5265 | 258 | 38274 | 1825 |
| කැකිරාව | 38175 | 2276 | 5186 | 192 | 43361 | 2468 |
| ගලෙන්බිඳුණුවැව | 26931 | 1586 | 0 | 0 | 26931 | 1586 |
| කැබිතිගොල්ලෑව | 29235 | 1642 | 1870 | 103 | 31105 | 1745 |
| අනුරාධපුර දිස්ත්‍රික්කය | **186134** | **10171** | **21563** | **973** | **207697** | **11144** |
| පොළොන්නරුව | 20296 | 1039 | 9824 | 305 | 30120 | 1344 |
| හිඟුරක්ගොඩ | 29166 | 1398 | 8849 | 389 | 38015 | 1787 |
| දිඹුලාගල | 23500 | 1249 | 1948 | 67 | 25448 | 1316 |
| පොළොන්නරුව දිස්ත්‍රික්කය | **72962** | **3686** | **20621** | **761** | **93583** | **4447** |
| උතුරු මැද පළාත | **259096** | **13857** | **42184** | **1734** | **301280** | **15591** |

## අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරී තොරතුරු 2023
## උතුරු මැද පළාත

| අනු අංකය | ආයතනය | අනුමත | සිටින | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 25 | 17 | 8 |
| 2 | අනුරාධපුර කලාපය | 25 | 8 | 17 |
| 3 | තඹුත්තේගම කලාපය | 22 | 6 | 16 |
| 4 | කැකිරාව කලාපය | 24 | 7 | 17 |
| 5 | ගලෙන්බිඳුණුවැව කලාපය | 22 | 5 | 17 |
| 6 | කැබිතිගොල්ලෑව කලාපය | 23 | 7 | 16 |
| **අනුරාධපුර දිස්ත්‍රික්කය** | | **141** | **50** | **91** |
| 7 | පොලොනන්රුව කලාපය | 17 | 5 | 12 |
| 8 | හිඟුරක්ගොඩ කලාපය | 22 | 5 | 17 |
| 9 | දිඹුලාගල කලාපය | 18 | 5 | 13 |
| පොලොනන්රුව **දිස්ත්‍රික්කය** | | **57** | **15** | **42** |
| | උතුරු මැද පළාත | **198** | **65** | **133** |

## ශ්‍රේණිධාරී විදුහල්පති තොරතුරු - 2023

| කලාපය | 01/2016 චක්‍රලේඛය අනුව අනුමත සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව |
|---|---|---|
| අනුරාධපුර | 202 | 218 |
| තඹුත්තේගම | 115 | 113 |
| කැකිරාව | 182 | 113 |
| ගලෙන්බිඳුණුවැව | 129 | 91 |
| කැබිතිගොල්ලෑව | 155 | 82 |
| **අනුරාධපුර දිස්ත්‍රික්කය** | **783** | **617** |
| පොළොන්නරුව | 78 | 68 |
| හිඟුරක්ගොඩ | 123 | 58 |
| දිඹුලාගල | 132 | 75 |
| **පොළොන්නරුව දිස්ත්‍රික්කය** | **333** | **201** |
| **උතුරු මැද පළාත** | **1116** | **818** |

## මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාර හා තාක්ෂණ පීඨ උතුරු මැද පළාත - කලාප මට්ටමින්

| කලාපය | මහින්දෝදය විද්‍යාගාර | තාක්ෂණ පීඨ |
|---|---|---|
| අනුරාධපුර | 12 | 2 |
| කැකිරාව | 12 | 3 |
| තඹුත්තේගම | 9 | 4 |
| ගලෙන්බිඳුණුවැව | 9 | 2 |
| කැබිතිගොල්ලෑව | 12 | 3 |
| **අනුරාධපුර දිස්ත්‍රික්කය** | **54** | **14** |
| පොළොන්නරුව | 8 | 3 |
| හිඟුරක්ගොඩ | 12 | 4 |
| දිඹුලාගල | 9 | 3 |
| **පොලොන්නරුව දිස්ත්‍රික්කය** | **29** | **10** |
| **උතුරු මැද පළාත** | **83** | **24** |

## පිරිවෙන් තොරතුරු - උතුරු මැද පළාත කලාප මට්ටමින්

| කලාපය | මහා පිරිවෙන් | විද්‍යායතන පිරිවෙන් | මූලික පිරිවෙන් | සීලමාතා පිරිවෙන් | එකතුව |
|---|---|---|---|---|---|
| අනුරාධපුර | 5 | - | 9 | - | 14 |
| කැකිරාව | 3 | 2 | 5 | 1 | 11 |
| තඹුත්තේගම | 4 | - | 3 | - | 7 |
| ගලෙන්බිඳුණුවැව | 2 | - | 7 | - | 9 |
| කැබිතිගොල්ලෑව | 1 | 1 | 3 | - | 5 |
| **අනුරාධපුර දිස්ත්‍රික්කය** | **15** | **3** | **27** | **1** | **46** |
| පොළොන්නරුව | 3 | - | 1 | - | 4 |
| හිඟුරක්ගොඩ | 2 | - | 5 | - | 7 |
| දිඹුලාගල | 2 | - | 2 | - | 4 |
| **පොලොන්නරුව දිස්ත්‍රික්කය** | **7** | **0** | **8** | **0** | **15** |
| **උතුරු මැද පළාත** | **22** | **3** | **35** | **1** | **61** |

## විශේෂ අධ්‍යාපන ඒකක ක්‍රියාත්මකවන පාසල් වල තොරතුරු
## උතුරු මැද පළාත

| අනු අංකය | කලාපය | පාසල් සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව | | | ගුරුවරු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| | | | පිරිමි | ගැහැණු | එකතුව | |
| 1 | අනුරාධපුර | 13 | 109 | 79 | **188** | 37 |
| 2 | තඹුත්තේගම | 7 | 39 | 26 | **65** | 9 |
| 3 | කැකිරාව | 9 | 41 | 26 | **67** | 11 |
| 4 | ගලෙන්බිඳුණුවැව | 4 | 30 | 17 | **47** | 8 |
| 5 | කැබිතිගොල්ලෑව | 4 | 21 | 16 | **37** | 9 |
| **අනුරාධපුර දිස්ත්‍රික්කය** | | **37** | **240** | **164** | **404** | **74** |
| 6 | පොළොන්නරුව | 8 | 39 | 21 | **60** | 16 |
| 7 | හිඟුරක්ගොඩ | 12 | 41 | 21 | **62** | 20 |
| 8 | දිඹුලාගල | 5 | 16 | 9 | **25** | 7 |
| **පොළොන්නරුව දිස්ත්‍රික්කය** | | **25** | **96** | **51** | **147** | **43** |
| **උතුරු මැද පළාත** | | **62** | **336** | **215** | **551** | **117** |

**1.2** **<u>දැක්ම, මෙහෙවර හා ආයතනික අරමුණු</u>**

**<u>දැක්ම</u>**

"අනාගත අභියෝගයන්ට මුහුණ දියහැකි නිපුණතා සපිරි දරු පිරිසක්, සමෘද්ධිමත් පළාතක් "

**<u>මෙහෙවර</u>**

"අධ්‍යාපනයේ සම අවස්ථා සලසමින් මානව සම්පත් හා භෞතික සම්පත් මනා කළමණාකාරිත්වයකින් යුතුව භාවිතකර උතුරු මැද පළාත සමෘද්ධිමත් කිරිම සඳහා දායකත්වය සැපයීම "

**<u>දිගුකාලීන අරමුණු</u>**

- උතුරු මැද පළාතේ පාසල් අධ්‍යාපනය ලබන දරුවන් බුද්ධිමත් හා රැකියා වෙළඳපොළට සුදුසු නිපුණතා ඇති දරුවන් බවට පත් කිරීම.
- ඉපැරණි රජරට සංස්කෘතිය හා කෘෂි ජීවන රටාව මෙන්ම දේශීය හර පද්ධතිය හා සාරධර්ම අගය කරන පුරවැසි පිරිසක් පාසල් අධ්‍යාපනය තුලින් බිහි කිරීම.


**<u>කෙටිකාලීන අරමුණු</u>**

- උතුරු මැද පළාතේ අනිවාර්යය අධ්‍යාපන වයස් සීමාව තුළ සිටින සියලුම දරුවන් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම සහ එහි ගුණාත්මකභාවය ඉහළ නැංවීම.
- උතුරු මැද පළාතේ පාසල්වල ඉගැන්වීම් කාර්යයයේ නියුතු ගුරුවරුන්ගේ ඉගැන්වීම් කුසලතා හා ක්‍රමවේදයන් ඉහළ තලයට ගෙන ඒමට අවශ්‍ය මඟපෙන්වීම් සිදුකිරීම.
- උතුරු මැද පළාතේ අධ්‍යාපන ක්‍රියාවලිය සඳහා අවශ්‍යවන්නා වූ භෞතික, මානව හා මූල්‍ය සම්පත් සැපයීම.
- පළාතේ පාසල් දරුවන්ගේ කායික, මානසික සංවර්ධනය සහ කුසලතා ඉහළ නැංවීම.
- ඵලදායී ඉගෙනුම් පරිසරයක් ගොඩනැගිය හැකිවන පරිදි නිලධාරීන්ගේ හා විදුහල්පතිවරුන්ගේ කළමණාකරණ ශක්තිය ඉහළ නැංවීම.

### 1.3 ප්‍රධාන කාර්යයන්

- අධ්‍යාපනයේ සමානාත්මතාවය ශක්තිමත් කිරීම: සියළුම දරුවන්ට සමාන ඉගෙනුම් අවස්ථා ඇති කිරීම.
- සාමාන්‍ය අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම.
- සාමාන්‍ය අධ්‍යාපනයේ භාරකාරත්වය සහ සේවා සැපයීම ශක්තිමත් කිරීම .
- සාක්ෂි පදනම් කරගත් අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනය හා සැලසුම් වැඩි දියුණු කිරීම.

## 1.4 සංවිධාන සැලැස්ම


පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (සංවර්ධන)
අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (පාලන)
අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (සැලසුම්)
අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (මුදල්)
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (සංවර්ධන)
පාසල් ගොඩනැගිලි ඉංජිනේරු
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (පාලන)
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (සැලසුම්)
ගණකාධිකාරී
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සංවර්ධන/විෂය)
තාක්ෂණ නිලධාරි (විශේෂ)
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පාලන)
පරිපාලන නිලධාරි
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සැලසුම්)
මුදල් සහකාර
මුදල් අයකැමි(සරප්)
තාක්ෂණ නිලධාරි
සංවර්ධන සහකාර/කළමණාකාර සහකාර
ප්‍රධාන ලිපිකරු
සංවර්ධන සහකාර/කළමණාකාර සහකාර
සංවර්ධන සහකාර/කළමණාකාර සහකාර
සංවර්ධන සහකාර/කළමණාකාර සහකාර
සංවර්ධන සහකාර/කළමණාකාර සහකාර
සංවර්ධන සහකාර/කළමණාකාර සහකාර
කා.කා.ස
කා.කා.ස
කා.කා.ස
කා.කා.ස
කා.කා.ස
කා.කා.ස
රියදුරු
මුරකරු
කම්කරු

**1.5 ආයතනය යටතේ ඇති දෙපාර්තමේන්තු, අධිකාරි සහ වෙනත් උප කාර්යාල**

උතුරු මැද පළාත්
අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක ආයතන

| | |
|---|---|
| 01 | පාසල් - 810 |
| 02 | කලාප අධ්‍යාපන කාර්යාල - 08 |
| 03 | කොට්ඨාස අධ්‍යාපන කාර්යාල - 30 |
| 04 | අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථාන - 02<br>- අනුරාධපුර<br>- කැකිරාව |
| 05 | ගුරු සංවර්ධන මධ්‍යස්ථාන - 09<br>- අනුරාධපුර<br>- පදවිය<br>- කැකිරාව<br>- තඹුත්තේගම<br>- ගලෙන්බිඳුණුවැව<br>- බකමූණ<br>- මින්නේරිය<br>- පොළොන්නරුව<br>- මනම්පිටිය |
| 06 | පළාත් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන - 01 |
| 07 | කලාපීය පරිගණක සම්පත් මධ්‍යස්ථාන - 08<br>- අනුරාධපුර<br>- තඹුත්තේගම<br>- කැකිරාව<br>- ගලෙන්බිඳුණුවැව<br>- කැබිතිගොල්ලෑව<br>- පොළොන්නරුව<br>- හිඟුරක්ගොඩ<br>- දිඹුලාගල |

## 1.6 දෙපාර්තමේන්තුව සඳහා අරමුදල් ලැබෙන ප්‍රභවයන්

i. සාමූහික ප්‍රදාන
ii. පළාත් සංවර්ධන ප්‍රදාන
iii. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන
iv. ලෝක බැංකුව

## 1.7 විදේශ ආධාර ව්‍යාපෘති

අ ) ව්‍යාපෘතියේ නම:- සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය (GEMP)
ආ ) දායක නියෝජිතායතනය:- ලෝක බැංකුව
ඇ ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම - රු. මිලියන 1650 ( 2020 - මි 45 , 2021 - මි 230, 2022 - මි 330, 2023 - මි 450, 2024 - මි 550)
ඇ ) ව්‍යාපෘති කාල සීමාව:- වසර 5

අ ) ව්‍යාපෘතියේ නම:- තාක්ෂණ අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය
ආ ) දායක නියෝජිතායතනය:- OFID (Austria)
ඇ ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම - රු. මිලියන 135
ඇ ) ව්‍යාපෘති කාල සීමාව:- වසර 5

අ ) ව්‍යාපෘතියේ නම:- ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන ද්වීතීයික අධ්‍යාපන ආංශික වැඩිදියුණු කිරීමේ වැඩසටහන
ආ ) දායක නියෝජිතායතනය:- SESIP
ඇ ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම - රු. මිලියන 100
ඇ ) ව්‍යාපෘති කාල සීමාව:- වසර 5

**පරිච්ඡේදය - 02**

**ප්‍රගතිය හා ඉදිරි දැක්ම**

2023 වර්ෂය සූදානම් සහිතව, විශේෂයෙන් එක්සත් ජාතීන්ගේ ගෝලීය තිරසර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම අභිප්‍රාය කොට ගෙන සාර්ථක ආරම්භයක් ඇති කළද, 2022 වර්ෂයේ පැවැති පශ්චාත් වසංගත තත්වය හේතු කොට ඇතිකල බලපෑම් තුලින් මෙම වර්ෂය කෙරෙහිද ඇතිකළ අහිතකර ප්‍රතිඵලයක් වූයේ පාසල් අධ්‍යයන වාර දීර්ඝ වීමයි. මේ හේතු කොට මෙම වසර තුල අ.පො.ස සාමාන්‍ය පෙළ විභාග දෙකක් එකම වසර තුල පැවැත්වීම අභියෝගාත්මක තත්ත්වයක් ඇති කරන ලදී. එබැවින් ද්විතියික අධ්‍යාපනය ලබන සිසු දරුවන් වෙත මෙම තත්වය තරමක් දුරට අවාසි සහගත බලපෑම් එල්ල කරනු ලැබුවේ වසර තුල පැවති නිවාඩු දිනයන්ද ක්‍රියාත්මක වීමේදී ඔවුන් ගේ අධ්‍යයන කාල සීමා අඩු වීම වැනි තත්ත්වයන් උද්ගතවූ බැවිනි. මෙම තත්ත්වයන් 2023 වර්ෂයේ සමස්ථ ප්‍රගතියේ ඌණ සාධනය කෙරෙහිද බලපෑම් එල්ල කරන ලදි.

එසේ නමුදු ප්‍රාථමික අධ්‍යාපන අංශය තුල යම් කැපීපෙනෙන වර්ධනයක් ඇතිකරවීමට මෙම වසර තුල හැකියාව ලැබිණ. ඒ අනුව මෙවර පහ ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය පිළිබඳව සමාජය තුල යම් කතිකාවක් ඇති කළද පළාත තුළ ඉහළ ප්‍රතිඵල පෙන්නුම් කිරීම කැපීපෙනෙන ලක්ෂණයක් විය. තවද මෙවර ශිෂ්‍යත්ව විභාග ප්‍රතිඵල අනුව වාර්ෂික ඉලක්කය සපුරා ගැනීමේ කාර්යය සාධනය 96%කි.

2022 වර්ෂයේ අ.පො.ස.(සා.පෙළ) ප්‍රතිඵල අනුව ගණිතය විෂයය සමත් ප්‍රතිශතය 68.5%කි. එම ඉලක්කය සාධනය කර ගැනීම 100% කින් සපුරා ගැනීමට නොහැකි වුවද, 2022 වර්ෂයට සාපේක්ෂව 1%ක වර්ධනයක් අත්පත්කර ගෙන ඇත. මෙම ජයග්‍රහණ ලබා ගැනීම සඳහා කලාප හා පළාත් ඒකාබද්ධව සැලසුම් කළ ක්‍රියාකාරකම් ඒ අයුරින්ම සිදුකළ නොහැකි වූ නමුත් මාර්ගගතව හා දුරස්ථව කළ හැකි ක්‍රියාකාරකම් හඳුනාගෙන ක්‍රියාත්මක කරන ලදී.

උසස් පෙළ විද්‍යා විෂයය ධාරාව හා තාක්ෂණවේදය විෂයයධාරාව සහභාගිත්ව අනුපාතය උතුරු මැද පළාත තුළ 24% ක අගයක් ගනී. ඉලක්කය සාධනය කර ගැනීම 75% කි. මෙම අංශයේ කාර්ය සාධනය අත්පත් කර ගැනීම සඳහා , විද්‍යාව , ගණිතය, තොරතුරු තාක්ෂණය විෂයය ඉලක්ක කරගත් ගුරු/ සිසු වැඩසටහන්, අ.පො.ස.(සා.පෙළ) ප්‍රතිඵල ගුණාත්මකව ඉහළ දැමීමේ වැඩසටහන්, උසස් පෙළ විද්‍යාව විෂයය ධාරාවේ ප්‍රතිඵල ඉහළ නැංවීමේ ගුරු/ සිසු වැඩසටහන්, උසස් පෙළ තාක්ෂණවේදය විෂයය ප්‍රතිඵල ඉහළ නැංවීමේ ගුරු / සිසු වැඩසටහන් 2023 වර්ෂය සඳහා හඳුනාගෙන තිබිණි. ඒ යටතේ සැලසුම් කළ ක්‍රියාකාරකම් පැවැති තත්ත්වය යටතේ ඒ අයුරින්ම ක්‍රියාත්මක කළ නොහැකි වුවත් මාර්ගගතව හා දුරස්ථව කළ හැකි ක්‍රියාකාරකම් හඳුනාගෙන ක්‍රියාත්මක කරන ලදී.

එසේම වසර තුළ පැවති විවිධ විෂය සමගාමී තරඟ සඳහා සහභාගී වීම තුලින් සමස්ථ ලංකා මට්ටමේ ජයග්‍රහණ ලබා ගැනීමට පළාතේ දරුවන් සමත් විය. ඒ අතරින් සමස්ථ ලංකා විද්‍යා ඔලිම්පියාඩ් තරඟාවලියේ රන් පදක්කම් දෙකක් සහ රිදී පදක්කමක් ජයග්‍රහණය කිරීමට උතුරු මැද පළාත සමත් වූ අතර ගණිත ඔලිම්පියාඩ් සමස්ථ ලංකා ජයග්‍රහණ 09ක් ලබා ගන්නා ලදි. එසේම සමස්ථ ලංකා ගණිත දැනුම මිණුම තරඟාවලියේ සිවුවන ස්ථානය දිනාගැනීමටත්, ඉංග්‍රීසි විෂය සඳහා ජයග්‍රහණ 11ක් දිනා ගැනීමටත්, සමාජ විද්‍යාව සඳහා ජාතික මට්ටමේ ජයග්‍රහණ 06 දිනාගැනීමටත්, සිංහල භාෂාව විෂයය සඳහා ජාතික මට්ටමේ තරඟ ජයග්‍රහණ 18ක් දිනා ගැනීමටත් අප දරුවන් සමත් විය.

එමෙන්ම පළාතේ ගුරුවරුන්ගේ ගැටළුවක්ව පැවති, සේවය ස්ථිර කිරීම් සම්බන්ධයෙන් පැවති ගැටළුව නිරාකරණය කර ගනිමින් සේවය ස්ථිර නොකළ ගුරුවරුන්ගේ සේවය ස්ථිර කිරීමට කටයුතු කර ඇති අතර සේවය ස්ථිර කිරීම සම්බන්ධයෙන් පැවති විගණන විමසුම් අවසන් කර ගැනීමට හැකි විය. 2023 වර්ෂයේ දෙපාර්තමේන්තුව වෙත ලැබුණු ගුරුවරුන්ගේ උසස්වීම් සම්බන්ධයෙන් පැවති ගැටළු නිරාකරණය

කරගනිමින් අවසන් කරන ලද අතර මෙම ක්‍රියාදාමය තුල ආයතන අංශය වෙත ලැබෙන විගණන විමසුම් අවම කර ගැනීමට හැකියාව ලැබිණි.

2023 වර්ෂය තුල ලැබුණු අත්දැකීම් උපයෝගී කරගෙන 2024 වර්ෂය තුල කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් ඉටු කිරීම දෙපාර්තමේන්තුවේ ඒකායන අරමුණ වේ.

**2023 - 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාග ප්‍රතිඵල විශ්ලේෂණ (2023 අගෝස්තු)**


**ලකුණු 100ට වඩා ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය - කලාප මට්ටමින්**

**2022**

| අ/අ | කලාපය | පෙනී සිටි | 70 ට වැඩි | 70 ට වැඩි ප්‍රතිශතය % | 100 ට වැඩි | 100 ට වැඩි ප්‍රතිශතය % | කඩඉම් සමත් | කඩඉම් සමත් ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | හිගුරක්ගොඩ | 3273 | 3024 | 92.39 | 2436 | 74.43 | 525 | 16.04 |
| 2 | තඹුත්තේගම | 3469 | 3184 | 91.78 | 2568 | 74.03 | 621 | 17.90 |
| 3 | කැකිරාව | 3556 | 3235 | 90.97 | 2515 | 73 | 558 | 15.69 |
| 4 | පොළොන්නරුව | 2280 | 2070 | 90.79 | 1672 | 73.33 | 495 | 21.71 |
| 5 | අනුරාධපුර | 5332 | 4731 | 88.73 | 3624 | 67.97 | 881 | 16.52 |
| 6 | ගලෙන්බිඳුණුවැව | 2272 | 2024 | 89.08 | 1504 | 66.20 | 290 | 12.76 |
| 7 | කැබිතිගොල්ලෑව | 2758 | 2479 | 89.88 | 1852 | 67.15 | 336 | 12.18 |
| 8 | දිඹුලාගල | 2198 | 1914 | 87.08 | 1425 | 64.83 | 261 | 11.87 |
| උතුරු මැද පළාත | | 25138 | 22661 | 90.15 | 17596 | 70.00 | 3967 | 15.78 |

**2023**

| අ/අ | කලාපය | පෙනී සිටි | 70 ට වැඩි | 70 ට වැඩි ප්‍රතිශතය % | 100 ට වැඩි | 100 ට වැඩි ප්‍රතිශතය % | කඩඉම් සමත් | කඩඉම් සමත් ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | පොළොන්නරුව | 2297 | 2020 | 87.94 | 1501 | 65.35 | 435 | 18.94 |
| 2 | තඹුත්තේගම | 3370 | 2954 | 87.66 | 2248 | 66.71 | 637 | 18.90 |
| 3 | හිගුරක්ගොඩ | 3281 | 2835 | 86.41 | 2068 | 63.03 | 497 | 15.15 |
| 4 | කැකිරාව | 3612 | 3120 | 86.38 | 2290 | 63.40 | 655 | 18.13 |
| 5 | ගලෙන්බිඳුණුවැව | 2317 | 1944 | 83.90 | 1334 | 57.57 | 281 | 12.13 |
| 6 | අනුරාධපුර | 5550 | 4653 | 83.84 | 3338 | 60.14 | 985 | 17.75 |
| 7 | දිඹුලාගල | 2159 | 1796 | 83.19 | 1250 | 57.90 | 252 | 11.67 |
| 8 | කැබිතිගොල්ලෑව | 2820 | 2311 | 81.95 | 1540 | 54.61 | 318 | 11.28 |
| උතුරු මැද පළාත | | **25406** | **21633** | **85.15** | **15569** | **61.28** | **4060** | **15.98** |




**පළාත් මට්ටමින් එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා අවම ලකුණු 50 බැගින් ලබාගෙන මුළු ලකුණු 100 ට වඩා ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය-**

## 2022

| අනු අංක | පළාත | පෙනීසිටි | 100 ට වැඩි | | ස්ථානය |
|---|---|---|---|---|---|
| | | | සංඛ්‍යාව | ප්‍රතිශතය | |
| 1 | සබරගමුව පළාත | **31,370** | **16,534** | **52.71** | **1** |
| 2 | දකුණු පළාත | **41,935** | **21,957** | **52.36** | **2** |
| 3 | වයඹ පළාත | **40,811** | **21,331** | **52.27** | **3** |
| 4 | බස්නාහිර පළාත | **76,071** | **37,231** | **48.94** | **4** |
| 5 | ඌව පළාත | **23,564** | **11,234** | **47.67** | **5** |
| 6 | උතුරු මැද පළාත | **25,138** | **11,937** | **47.49** | **6** |
| 7 | මධ්‍යම පළාත. | **44,635** | **18,912** | **42.37** | **7** |
| 8 | උතුරු පළාත | **17,627** | **7,344** | **41.66** | **8** |
| 9 | නැගෙනහිර පළාත | **28,517** | **11,054** | **38.76** | **9** |
| | සමස්ත දිවයින | **329,668** | **157,624** | **47.81** | |

**2023**

| අනු අංක | පළාත | පෙනීසිටි | 100 ට වැඩි (ප්‍රශ්න පත්‍ර 2ටම 50 හෝ ඊට වැඩි) | | ස්ථානය |
|---|---|---|---|---|---|
| | | | සංඛ්‍යාව | ප්‍රතිශතය | |
| 1 | දකුණු පළාත | **41,448** | **20,943** | **50.53** | **1** |
| 2 | සබරගමුව පළාත | **31,615** | **15,830** | **50.07** | **2** |
| 3 | වයඹ පළාත | **40,326** | **19,741** | **48.95** | **3** |
| 4 | බස්නාහිර පළාත | **75,780** | **36,192** | **47.76** | **4** |
| 5 | ඌව පළාත | **24,568** | **11,114** | **45.24** | **5** |
| 6 | උතුරු මැද පළාත | **25,406** | **10,911** | **42.95** | **6** |
| 7 | මධ්‍යම පළාත. | **45,620** | **18,609** | **40.79** | **7** |
| 8 | උතුරු පළාත | **18,503** | **6,645** | **35.91** | **8** |
| 9 | නැගෙනහිර පළාත | **29,683** | **10,032** | **33.80** | **9** |
| | සමස්ත දිවයින | **332,949** | **150,017** | **45.06** | |

**කඩඉම් ලකුණු ඉක්මවා ගිය ප්‍රතිශතය - පළාත්**


කඩඉම් ලකුණු ඉක්මවා ගිය ප්‍රතිශතය - පළාත් මට්ටම

**2022**

| අනු අංක | පළාත | පෙනීසිටි | කඩයිම සමත් | | ස්ථානය |
|---|---|---|---|---|---|
| | | | සංඛ්‍යාව | ප්‍රතිශතය | |
| 1 | ඌව පළාත | **23,564** | **3,887** | **16.50** | **1** |
| 2 | සබරගමුව පළාත | **31,370** | **5,170** | **16.48** | **2** |
| 3 | දකුණු පළාත | **41,935** | **6,812** | **16.24** | **3** |
| 4 | වයඹ පළාත | **40,811** | **6,601** | **16.17** | **4** |
| **5** | උතුරු මැද පළාත | **25,138** | **3,957** | **15.74** | **5** |
| 6 | උතුරු පළාත | **17,627** | **2,749** | **15.60** | **6** |
| 7 | බස්නාහිර පළාත | **76,071** | **10,585** | **13.91** | **7** |
| 8 | නැගෙනහිර පළාත | **28,517** | **3,479** | **12.20** | **8** |
| 9 | මධ්‍යම පළාත. | **44,635** | **5,017** | **11.24** | **9** |
| | සමස්ත දිවයින | **329,668** | **48,257** | **14.64** | |

**2023**

| අනු අංක | පළාත | පෙනිසිටි | කඩයිම සමත් | | ස්ථානය |
|---|---|---|---|---|---|
| | | | සංඛ්‍යාව | ප්‍රතිශතය | |
| 1 | සබරගමුව පළාත | **31,615** | **5,589** | **17.68** | **1** |
| 2 | දකුණු පළාත | **41,448** | **7,139** | **17.22** | **2** |
| 3 | වයඹ පළාත | **40,326** | **6,814** | **16.90** | **3** |
| 4 | ඌව පළාත | **24,568** | **4,047** | **16.47** | **4** |
| 5 | උතුරු මැද පළාත | **25,406** | **4,060** | **15.98** | **5** |
| 6 | උතුරු පළාත | **18,503** | **2,804** | **15.15** | **6** |
| 7 | බස්නාහිර පළාත | **75,780** | **11,405** | **15.05** | **7** |
| 8 | නැගෙනහිර පළාත | **29,683** | **3,533** | **11.90** | **8** |
| 9 | මධ්‍යම පළාත. | **45,620** | **5,273** | **11.56** | **9** |
| | සමස්ත දිවයින | **332,949** | **50,664** | **15.22** | |



## අ.පො.ස (සා.පෙළ) කලාප මට්ටමින් සමස්ථ ප්‍රතිඵල විශ්ලේෂණය -2021(2022)

| කලාපය | පෙනී සිටි | | | සමත් | | | සමත් % | | | අසමත් | | | අසමත් % | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ස්ත්‍රී | පුරුෂ | එකතුව | ස්ත්‍රී | පුරුෂ | එකතුව | ස්ත්‍රී | පුරුෂ | එකතුව | ස්ත්‍රී | පුරුෂ | එකතුව | ස්ත්‍රී | පුරුෂ | එකතුව |
| පොළොන්නරුව | 1040 | 1033 | 2073 | 866 | 678 | 1544 | 83.27 | 65.63 | 74.48 | 174 | 355 | 529 | 16.73 | 34.37 | 25.52 |
| අනුරාධපුර | 2506 | 2512 | 5018 | 2042 | 1564 | 3606 | 81.48 | 62.26 | 71.86 | 464 | 948 | 1412 | 18.52 | 37.74 | 28.14 |
| කැකිරාව | 1467 | 1450 | 2917 | 1220 | 871 | 2091 | 83.16 | 60.07 | 71.68 | 247 | 579 | 826 | 16.84 | 39.93 | 28.32 |
| ගලෙන්බිඳුනුවැව | 923 | 845 | 1768 | 756 | 508 | 1264 | 81.91 | 60.12 | 71.49 | 167 | 337 | 504 | 18.09 | 39.88 | 28.51 |
| කැබිතිගොල්ලෑව | 1134 | 1116 | 2250 | 930 | 657 | 1587 | 82.01 | 58.87 | 70.53 | 204 | 459 | 663 | 17.99 | 41.13 | 29.47 |
| තඹුත්තේගම | 1364 | 1320 | 2684 | 1122 | 753 | 1875 | 82.26 | 57.05 | 69.86 | 242 | 567 | 809 | 17.74 | 42.95 | 30.14 |
| දිඹුලාගල | 915 | 855 | 1770 | 731 | 505 | 1236 | 79.89 | 59.06 | 69.83 | 184 | 350 | 534 | 20.11 | 40.94 | 30.17 |
| හිඟුරක්ගොඩ | 1370 | 1443 | 2813 | 1121 | 795 | 1916 | 81.82 | 55.09 | 68.11 | 249 | 648 | 897 | 18.18 | 44.91 | 31.89 |
| උතුරු මැද පළාත | **10719** | **10574** | **21293** | **8788** | **6331** | **15119** | **81.99** | **59.87** | **71.00** | **1931** | **4243** | **6174** | **18.01** | **40.13** | **29.00** |

## අ.පො.ස (සා.පෙළ) කලාප මට්ටමින් සමස්ථ ප්‍රතිඵල විශ්ලේෂණය -2022(2023)

| කලාපය | පෙනී සිටි | | | සමත් | | | සමත් % | | | අසමත් | | | අසමත් % | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ස්ත්‍රී | පුරුෂ | එකතුව | ස්ත්‍රී | පුරුෂ | එකතුව | ස්ත්‍රී | පුරුෂ | එකතුව | ස්ත්‍රී | පුරුෂ | එකතුව | ස්ත්‍රී | පුරුෂ | එකතුව |
| අනුරාධපුර | 2613 | 2529 | 5142 | 2145 | 1625 | 3770 | 82.09 | 64.25 | 73.32 | 468 | 904 | 1372 | 17.91 | 35.75 | 26.68 |
| ගලෙන්බිඳුනුවැව | 991 | 997 | 1988 | 808 | 636 | 1444 | 81.53 | 63.79 | 72.64 | 183 | 361 | 544 | 18.47 | 36.21 | 27.36 |
| පොළොන්නරුව | 1059 | 1118 | 2177 | 847 | 732 | 1579 | 79.98 | 65.47 | 72.53 | 212 | 386 | 598 | 20.02 | 34.53 | 27.47 |
| කැකිරාව | 1596 | 1589 | 3185 | 1270 | 991 | 2261 | 79.57 | 62.37 | 70.99 | 326 | 598 | 924 | 20.43 | 37.63 | 29.01 |
| කැබිතිගොල්ලෑව | 1161 | 1094 | 2255 | 897 | 661 | 1558 | 77.26 | 60.42 | 69.09 | 264 | 433 | 697 | 22.74 | 39.58 | 30.91 |
| තඹුත්තේගම | 1424 | 1297 | 2721 | 1106 | 716 | 1822 | 77.67 | 55.20 | 66.96 | 318 | 581 | 899 | 22.33 | 44.80 | 33.04 |
| දිඹුලාගල | 835 | 836 | 1671 | 636 | 453 | 1089 | 76.17 | 54.19 | 65.17 | 199 | 383 | 582 | 23.83 | 45.81 | 34.83 |
| හිඟුරක්ගොඩ | 1423 | 1425 | 2848 | 1092 | 736 | 1828 | 76.74 | 51.65 | 64.19 | 331 | 689 | 1020 | 23.26 | 48.35 | 35.81 |
| උතුරු මැද පළාත | **11102** | **10885** | **21987** | **8801** | **6550** | **15351** | **79.27** | **60.17** | **69.82** | **2301** | **4335** | **6636** | **20.73** | **39.83** | **30.18** |

## අ.පො.ස සාමාන්‍යපෙළ ප්‍රතිඵල විශ්ලේශණය 2021 (2022)
## සියලුම විෂයන් සඳහා "A" සාමාර්ථ ලැබූ සිසුන් ප්‍රමාණය කලාප අනුව පෙලගැස්ම

| අනු | කලාපය | පෙනී සිටි | | | A9 | | | A9 % | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ස්ත්‍රී | පුරුෂ | එකතුව | ස්ත්‍රී | පුරුෂ | එකතුව | ස්ත්‍රී % | පුරුෂ% | එකතුව % |
| 1 | අනුරාධපුර | 2613 | 2529 | 5142 | 155 | 86 | 241 | 5.93 | 3.40 | 4.69 |
| 2 | පොළොන්නරුව | 1059 | 1118 | 2177 | 56 | 32 | 88 | 5.29 | 2.86 | 4.04 |
| 3 | කැකිරාව | 1596 | 1589 | 3185 | 64 | 16 | 80 | 4.01 | 1.01 | 2.51 |
| 4 | කැබිතිගොල්ලෑව | 1161 | 1094 | 2255 | 25 | 6 | 31 | 2.15 | 0.55 | 1.37 |
| 5 | හිඟුරක්ගොඩ | 1423 | 1425 | 2848 | 26 | 12 | 38 | 1.83 | 0.84 | 1.33 |
| 6 | තඹුත්තේගම | 1424 | 1297 | 2721 | 16 | 4 | 20 | 1.12 | 0.31 | 0.74 |
| 7 | ගලෙන්බිඳුනුවැව | 991 | 997 | 1988 | 7 | 4 | 11 | 0.71 | 0.40 | 0.55 |
| 8 | දිඹුලාගල | 835 | 836 | 1671 | 6 | 1 | 7 | 0.72 | 0.12 | 0.42 |
| උතුරු මැද පළාත | | **11102** | **10885** | **21987** | **355** | **161** | **516** | **3.20** | **1.48** | **2.35** |

## අ.පො.ස සාමාන්‍යපෙළ ප්‍රතිඵල විශ්ලේශණය 2022 (2023)
## සියලුම විෂයන් සඳහා "A" සාමාර්ථ ලැබූ සිසුන් ප්‍රමාණය කලාප අනුව පෙලගැස්ම

| අනු | කලාපය | පෙනී සිටි | | | A9 | | | A9 % | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ස්ත්‍රී | පුරුෂ | එකතුව | ස්ත්‍රී | පුරුෂ | එකතුව | ස්ත්‍රී % | පුරුෂ% | එකතුව % |
| 1 | අනුරාධපුර | 2506 | 2512 | 5018 | 81 | 68 | 149 | 3.23 | 2.71 | 2.97 |
| 2 | දිඹුලාගල | 915 | 855 | 1770 | 5 | 3 | 8 | 0.55 | 0.35 | 0.45 |
| 3 | ගලෙන්බිඳුනුවැව | 923 | 845 | 1768 | 9 | 3 | 12 | 0.98 | 0.36 | 0.68 |
| 4 | හිඟුරක්ගොඩ | 1370 | 1443 | 2813 | 22 | 8 | 30 | 1.61 | 0.55 | 1.07 |
| 5 | කැබිතිගොල්ලෑව | 1134 | 1116 | 2250 | 19 | 5 | 24 | 1.68 | 0.45 | 1.07 |
| 6 | කැකිරාව | 1467 | 1450 | 2917 | 30 | 9 | 39 | 2.04 | 0.62 | 1.34 |
| 7 | පොළොන්නරුව | 1040 | 1033 | 2073 | 33 | 30 | 63 | 3.17 | 2.90 | 3.04 |
| 8 | තඹුත්තේගම | 1364 | 1320 | 2684 | 16 | 3 | 19 | 1.17 | 0.23 | 0.71 |
| උතුරු මැද පළාත | | 10719 | 10574 | 21293 | 215 | 129 | 344 | 2.01 | 1.22 | 1.62 |

## සපුරාගෙන ඇති ඉලක්ක

| කාර්යය සාධන ඉලක්කය | 2023 සඳහා ඉලක්කය | ඉලක්ක සපුරා ගැනීම |
|---|---|---|
| ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 100ට වැඩි ප්‍රතිශතය ඉහළ නැංවීම | 75% | 61% |
| අ.පො.ස.(සා/පෙළ) විභාගයෙන් උසස් පෙළ සඳහා සුදුසුකම් ලැබූ ප්‍රතිශතය | 75% | 75.12% |
| අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් සිංහල විෂයය සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම | 92% | 90.33% |
| අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් විද්‍යාව විෂයය සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම | 67% | 64.03% |
| අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් ඉංග්‍රිසි විෂයය සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම | 65% | 100% |
| අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් ගණිතය විෂයය සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම | 70% | 68.47% |
| අ.පො.ස.(උසස් පෙළ) සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම | 68% | 63.30% |
| අ.පො.ස.(උ/පෙළ)විද්‍යාව හා තාක්ෂණවේදය විෂයය ධාරාව සඳහා සහභාගිත්ව අනුපාතය ඉහළ නැංවීම | 35% | 32% |
| අ.පො.ස.(උ/පෙළ)වාණිජ විෂයය ධාරාව සඳහා සහභාගිත්ව අනුපාතය ඉහළ නැංවීම | 35% | 17% |
| අ.පො.ස.(උ/පෙළ)කලා විෂයය ධාරාව සඳහා සහභාගිත්ව අනුපාතය අඩු කිරීම | 35% | 51% |
| අ.පො.ස.උසස් පෙළ ජීව විද්‍යා විෂයය ධාරාවේ සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම | 45% | 42.45% |
| අ.පො.ස.උසස් පෙළ භෞතීය විද්‍යා විෂයය ධාරාවේ සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම | 45% | 52.64% |
| අ.පො.ස.උසස් පෙළ ඉංජිනේරු තාක්ෂණවේදය විෂයය ධාරාවේ සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම | 65% | 55.85% |
| අ.පො.ස.උසස් පෙළ ජෛව පද්ධති තාක්ෂණවේදය විෂයය ධාරාවේ සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම | 65% | 65.65% |
| අ.පො.ස.උසස් වාණිජ විෂයය ධාරාවේ සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම | 70% | 71.15% |
| අ.පො.ස.උසස් පෙළ කලා විෂයය ධාරාවේ සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම | 75% | 70.59% |

*** අ.පො.ස.(සා.පෙළ) ප්‍රතිඵල සඳහා අ.පො.ස.(සා.පෙළ) 2023 ප්‍රතිඵල විශ්ලේෂණ සලකා ඇත.

**** අ.පො.ස.(උ.පෙළ) ප්‍රතිඵල සඳහා අ.පො.ස.(උ.පෙළ) 2023 ප්‍රතිඵල විශ්ලේෂණ සලකා ඇත.

**ඉලක්ක සපුරාගැනීමේ දී ඇති වූ අභියෝග -**

- ගෝලීය වසංගත තත්වයේ පසු බලපෑම්.
- එසේම මෙම තත්වය හමුවේ පාසල් දීර්ඝ කාලයක් වසා තැබීම නිසා දරුවන්ගේ ඉගෙනුම් එල සාක්ෂාත් කර ගැනිම අභියෝගයට ලක් විම.
- රටතුල උද්ගතවූ ආර්ථික අර්බුදය හමුවේ සිදුවූ අධික වැය සහ මිල විචලන තත්වයන්.
- ප්‍රායෝගිකව ක්‍රියාකාරකම් පාදකව සංකල්ප සාධනය කළ යුතු විෂයයන් සඳහා දුරස්ථ ඉගෙනුම් ක්‍රමවේද අනුගමනය කිරීමේ දුෂ්කරතාවය.
- ප්‍රාථමික අවධියේ සිසුන් සඳහා දුරස්ථ අධ්‍යාපන උපක්‍රම එලදායී නොවීම.
- මාර්ගගත වැඩසටහන් සිදු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුමෙහි ගැටළු සහිත ගුරුභවතුන්
- සංඥා පහසුකම්වල දුර්වලතා.
- සිසුන් සඳහා උපකරණවල හිඟය.
- දෙපාර්තමේන්තු හා කලාප මට්ටමින් ද මාර්ගගත ඉගැන්වීම් සඳහා අවශ්‍ය උපකරණවල හිඟතාවය
- විශේෂ අධ්‍යාපන සිසුන් සඳහා දුරස්ථ අධ්‍යාපන උපක්‍රම නොගැලපීම.
- නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන් හරහා ලබා දෙන වෘත්තීය පුහුණුව මාර්ගගතව ලබා දීමේ ගැටළු.

**අනාගත අරමුණු -**

2023 වර්ෂයේ දී මෙතෙක් පැවති කොවිඩ් වසංගත තත්වයේ අවදානම අවම වීමත් සමගම දුරස්ථ අධ්‍යාපන ක්‍රම භාවිතයෙන් පාසල්වල අධ්‍යාපන කටයුතු කිරීම සඳහා දිරි ගැන්වීම වෙනුවට සජීවි පංති කාමර අත්දැකීම් සඳහා ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් ක්‍රමවේද සැලසුම් කර තිබේ. එසේ නොවන අවස්තා වලදී වෙනත් මාර්ගගත ක්‍රම භාවිතා කළ හැකි උපකරණ භාවිතයෙන් අධ්‍යයන කටයුතු කිරීමට පහසු වන ලෙස පාඩම් මාලාවන් සිසුන්ට සමීප කිරීමට ඊ තක්සලාව හා ගුරු ගෙදර වැඩ සටහන් සඳහා සිසුන් යොමු කිරීම සිදුකෙරේ.

එසේම 2022, අතපසු වූ විෂයය කරුණු සිසුවාට ලඟා කර වීම සඳහා අනාවරණ පරීක්ෂණ මගින් සිසුන් අනාවරණය කරගෙන ඒ අනුව ශිෂ්‍ය ප්‍රතිපෝෂණ වැඩසටහන් සැලසුම් කර ඇත.

අධ්‍යාපන සංවර්ධනයේදී සුවිශේෂී වශයෙන් පහත සඳහන් තිරසර සංවර්ධන ගෝලීය අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කර ඇත.

1) එලදායී ඉගෙනුම් ප්‍රතිඵල ලබාගැනීමට හැකිවන ආකාරයෙන් සියලුම ගැහැණු ළමුන් හා පිරිමි ළමුන් නිදහස් සමාන සහ ගුණාත්මක භාවයෙන් ඉහළ ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනය සඳහා යොමු කිරීම.

2) සියලුම කාන්තාවන්ට හා පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහළ සහ දැරියහැකි විශ්වවිද්‍යාල අධ්‍යාපනය ද ඇතුළත් තාක්ෂණික, වෘත්තීය සහ තෘතීයික අධ්‍යාපනය සඳහා සමාන ප්‍රවේශයක් සහතික කිරීම.

3) අභිමානවත් රැකියාවන් සහ ව්‍යවසායකත්වයක් සඳහා තාක්ෂණික හා වෘත්තීය සුදුසුකම් වලින් යුත් අවශ්‍ය කුසලතා ලබා සිටින තරුණයින් සහ වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමකින් ඉහළ නැංවීම.

4) අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පවත්නා වෙනස්කම් තුරන්කිරීම සහ ආබාධිත පුද්ගලයින්, ආදි වශයෙන් සහ අවදානමට ලක්විය හැකි අවස්ථාවන්හි සිටින ළමුන් ඇතුළු අවදානම් සහිත

පුද්ගලයින් සඳහා සියළු මට්ටමේ අධ්‍යාපනය සහ වෘත්තීය පුහුණුව සඳහා සමාන ප්‍රවේශයක් සහතික කිරිම.

5) සියලු ම තරුණයින් හා කාන්තා හා පිරිමි වැඩිහිටි පුද්ගලයින්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් අකුරු හැකියාව සහ ගණන් කිරීමේ හැකියාව අත් කර ගන්නා බවට සහතික වීම.

.

6) තිරසර සංවර්ධනය සහ තිරසර ජීවන රටාවන්, මානව හිමිකම්, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, සාමය හා අවිහිංසාවාදී සංස්කෘතිය, ගෝලීය පුරවැසිභාවය සහ සංස්කෘතික විවිධත්වය අගය කිරීම හා තිරසර සංවර්ධනය සඳහා සංස්කෘතියේ දායකත්වය ප්‍රවර්ධනය කිරීම.

7) ළමයින්, ආබාධිතභාවය සහ ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ සැලකිලිමත් වන අධ්‍යාපන පහසුකම් සහ සැමට ආරක්ෂිත, අවිහිංසාවාදී, ඵලදායි ඉගෙනුම් පරිසරයක් ගොඩනැගීම.

8) වැඩි දුෂ්කරතාවයක් සහිත පාසල් වල ගුරු පුහුණුව සඳහා අධ්‍යාපන විශේෂඥ සේවා මත සුදුසුකම් ලත් ගුරුවරුන්ගේ සැපයුම සැලකිය යුතු ලෙස වැඩිකිරීම.

අධ්‍යාපන සැලසුම්කරණය මගින් සිසුන්ගේ සමාජ-ආර්ථික පසුබිම නොසලකා සියලු සිසුන්ට ගුණාත්මක අධ්‍යාපනය සඳහා සාධාරණ ප්‍රවේශයක් ලබා දීම තුලින් ඉගෙන ගන්නන් අතර විවේචනාත්මක චින්තනය, නිර්මාණශීලිත්වය සහ ගැටළු විසඳීමේ කුසලතා වර්ධනය කිරීම අරමුණු කරයි. අධ්‍යාපන ක්‍රියාවලියේදී, ශීඝ්‍රයෙන් පරිණාමය වන වර්තමාන ලෝකයේ නව අභියෝගවලට අනුවර්තනය වීමේ සහ නව්‍යකරණය කිරීමේ හැකියාව ප්‍රමුඛ වේ. අධ්‍යාපන සැලසුම්කරණයේ අරමුණ වන්නේ මෙම අත්‍යවශ්‍ය කුසලතා ඇති කිරීම, සංකීර්ණ ගැටළු විසඳීමට සහ දැනුවත් තීරණ ගැනීමට අවශ්‍ය මෙවලම් සමඟ සිසුන් , ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් සන්නද්ධ කිරීමයි.

**අංශය පවත්නා තත්ත්වය පිළිබඳ විග්‍රහය.**

<u>ශක්තීන්</u>

- මනා මගපෙන්වීමක් සහිත උපදේශනාත්මක නායකත්වයන්
- සේවය සඳහා කැප වූ ආයතන කාර්යය මණ්ඩලය
- 16000 පමණ වූ ගුරුභවතුන්
- 920 පමණ වූ විදුහල්පතිවරුන්
- මනා කැපවීමක් සහිත අධ්‍යාපන පරිපාලන සේවා නිළධාරීන්
- ඉහළ අපේක්ෂන සහිත පාසල් ප්‍රජාව

<u>දුර්වලතාවයන්</u>

- අධ්‍යාපන පරිපාලන සේවා නිළධාරි හිඟය.
- ගුරු හිඟය.
- ගුරු උපදේශක හිඟය
- තාක්ෂණ උපකරණයන්ගේ හිඟතාවය
- ප්‍රවාහන පහසුකම් හිඟය.
- අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා වන වැඩසටහන් වල පවත්නා දුර්වලතා.
- ස්ථාවර වත්කම් හඟතාවයන් හා යටිතල පහසුකම්හි පවත්නා දුර්වලතා

අවස්ථාවන්

- අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික අධ්‍යාපන අමාත්‍යාංශය, දූරස්ථ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය මගින් ලබා දෙන සහය හා මාර්ගෝපදේශකත්වය.
- පළාත් ප්‍රධාන අමාත්‍යාංශය, ප්‍රධාන අමාත්‍යාංශය මගින් ලබා දෙන සහය හා මාර්ගෝපදේශකත්වය.
- රාජ්‍ය නොවන සංවිධානවල සහය.
- විවිධ මූල්‍ය ප්‍රභේද යටතේ ලැබෙන මූල්‍ය ප්‍රතිපාදන.
- උතුරු මැද පළාත තුල පවත්නා බාහිර අධ්‍යාපන ආයතන, වෘත්තීය මාර්ගෝපදේශන ආයතන හා විශ්ව විද්‍යාලවලින් ලැබෙන සහයෝගය.

තර්ජන

- අධ්‍යාපන පරිපාලන සේවයේ නිළධාරීන් පහසුකම් වැඩි අගනගරයට හා අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යාමට වැඩි කැමැත්තක් දැක්වීම.
- විද්‍යා උපාධිධාරීන් ගුරු සේවයට ඇතුලත් වීම අඩු වීම.
- උසස් පෙළ සිසුන් පාසල් පද්ධතිය ක්‍රමයෙන් ප්‍රතික්ෂේප කරමින් පෞද්ගලික උපකාරක පන්ති පිළිබඳ වැඩි වශයෙන් විශ්වාස කිරීම.
- පාසල් ප්‍රජාවගේ සෘණාත්මක ආකල්ප.
- ගුරු තුලනය කිරීම් සඳහා ඇති බාධා.
- 2023 හා පෙර වසර වල අධ්‍යයන හා අනධ්‍යයන බඳවා ගැනීම් සිදු නොකළ හෙයින් කාර්ය මණ්ඩල ඌණතාවයන් ඇතිවීම හේතු කොට මතු වූ තර්ජන.

**ප්‍රධාන කාර්යසාධන දර්ශකය ලඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘති.**

| අනු අංකය | ප්‍රධාන කාර්යසාධන දර්ශකය (නිමැවුම) | ප්‍රමාණය | | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති | වියදම | ප්‍රතිලාභීන් / සහභාගීත්වය |
|---|---|---|---|---|---|---|
| | 4.6.2 සංඛ්‍යාමය කාර්ය කුසලතාවය සහිත ශිෂ්‍ය ප්‍රතිශතය | ගණිත විෂයය ඉලක්ක කරගත් ගුරු/සිසු වැඩසටහන් පැවැත්වීම. | * 2023 අ.පො.ස (සා.පෙළ) ගණිත ප්‍රතිඵලය 99% දක්වා ඉහල නැංවීම සඳහා 2022 වසරේ පාසල්වලට ලබා දී ඇති ස්වයං ඉගෙනුම් වැඩ පත්‍රිකා භාවිතා කරමින් ලකුණු 40ට අඩු සිසුන් සඳහා අඛණ්ඩ ප්‍රතිකර්ම ඉගෙනුම් වැඩසටහන් මාලාවක් පැවැත්වීම.<br><br>*2022 දී පවත්වන ලද ගුරු අනාවරණ පරීක්ෂණ ප්‍රතිඵල විශ්ලේෂණයට අනුව 2022 වර්ෂය තුළ පුහුණු වීමට අවස්ථාව නොලැබුණු පාසල් 410 ක ගණිත පත්වීම් ලද ගුරුවරුන් 500ක් සඳහා විෂය ආශ්‍රිත ගුරු පුහුණු ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම (GEMP).<br><br>* කලාප මට්ටමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් හා තත්ව කව පැවැත්වීම (GEMP). | 43%<br><br>32% | | 90% |
| 4.7. ළමයින්, ආබාධිතභාවය සහ ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ සැලකිලිමත් වන අධ්‍යාපන පහසුකම් සහ සැමට ආරක්ෂිත, අවිහිංසාවාදී, ඵලදායි ඉගෙනුම් පරිසරයක් ගොඩනැගීම. | 4.7.1 බාහිර මාර්ගෝපදේශ වැඩසටහන ක්‍රියාත්මක වන පාසල් සංඛ්‍යාව . | පළාතේ පාසල් සඳහා බාහිර මාර්ගෝපදේශ වැඩසටහන පැවැත්වීම | *ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම .<br><br>*මානව සම්පත් සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.<br><br>*වෘත්තීය මාර්ගෝපදේශ හා උපදේශන වැඩසටහන් පැවැත්වීම. | 10%<br><br>25% | 70% | |
| | 4.7.2 ඵලදායි ඉගෙනුම් පරිසරයක් ගොඩනැගීම උදෙසා භෞතික සම්පත් සැපයූ | පාසල් සහ අධ්‍යාපන ආයතන සඳහා ඉදිකිරීම්, අලුත්වැඩියා සහ මිලදී ගැනීම් සිදු කිරීම | * පාසල් සඳහා නව ගොඩනැගිලි ඉදිකිරීම.<br><br>* පාසල් සහ අධ්‍යාපන ආයතනවල ගොඩනැගිලි අළුත්වැඩියා සිදුකිරීම. | | | 100%<br><br>90% |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | පාසල් සහ අධ්‍යාපන ආයතන සංඛ්‍යාව | | * පාසල්වල ඩෙස් පුටු අළුත්වැඩියා කිරීම.<br><br>* පාසල් සහ අධ්‍යාපන ආයතන සඳහා උපකරණ (රසායන ද්‍රව්‍ය,පරිගණක,සුහුරු පුවරු,පුස්තකාල පොත්,කාර්යාල උපකරණ) මිලදී ගැනීම් සිදු කිරීම. | | 50% | 100% |
| | 4.7.3 ඵලදායි ඉගෙනුම් පරිසරයක් ගොඩනැගීම උදෙසා ව්‍යුහාත්මක වෙනස්කම් සිදුකළ පාසල් සංඛ්‍යාව | පාසල් ව්‍යුහ කටයුතු සිදු කිරීම | *ද්විතියික අංශ ආරම්භ කිරීම<br><br>*උසස් පෙළ පංති ආරම්භ කිරීම<br><br>*ද්විභාෂා පංති ආරම්භ කිරීම | | | 100%<br><br>100%<br><br>100% |
| 4.8. සංවර්ධනය වෙමින් පවතින, විශේෂයෙන්ම අවම වශයෙන් සංවර්ධිත රටවල හා කුඩා දූපත් ප්‍රාන්තවල ගුරු පුහුණුව සඳහා ජාත්‍යාන්තර සහයෝගීතාව ලබාගෙන සුදුසුකම්ලත් ගුරුවරුන්ගේ සැපයුම සැලකිය යුතු ලෙස වැඩිකිරීම. | 4.8.1 පාසල් පාදක වෘත්තීය ගුරු සංවර්ධන වැඩසටහන් සිදු කරන පාසල්සංඛ්‍යාව | පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | * පාසල් පාදක ගුරු සංවර්ධන විශිෂ්ට ව්‍යවහාර හඳුනාගැනීම හා නිර්ණායක සකස් කිරීම.<br><br>* පාසල් පාදක උපාධ්‍යායන පත්‍රිකා සකස් කිරීම.<br><br>* කලාප මට්ටමින් තෝරාගත් පාසල් වල සහභාගිත්වයෙන් තෛමාසික ප්‍රගති සමාලෝචන පැවැත්වීම (GEMP).<br><br>* පාසල් මට්ටමින් පාසල් පාදක වෘත්තීය ගුරු සංවර්ධන වැඩසටහන් සැලැස්ම සකස් කිරිම සඳහා පාසක තොරතුරු හදුනා ගැනිම, විදුහල්පතිවරුන්ගේ වැඩසටහන භාර ගුරුභවතුන්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරිම (GEMP).<br><br>* පාසල් පාදක වෘත්තිය ගුරු සංවර්ධන වැඩසටහන් පිළිබද තෛමාසික ප්‍රගති සමාලෝචන රුස්විම පැවැත්විම (GEMP). | 25%<br><br>30%<br><br>38%<br><br><br><br>35% | 62% | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | * පාසල්වල ක්‍රියාත්මක පාසල් පාදක වෘත්තිය සංවර්ධන වැඩසටහන්වල ප්‍රබලතා , ගැටලු පිළිබඳව සාකච්ඡා කිරීම තුළින් වැඩසටහන්වල ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා තත්වකව පැවැත්වීම (GEMP). | 31% | | |

**5.2. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය.**

**ඵලදායී ඉගෙනුම් ප්‍රතිඵල ලබාගැනීමට හැකිවන ආකාරයෙන් සියලුම ගැහැණු ළමුන් හා පිරිමි ළමුන් නිදහස් සමාන සහ ගුණාත්මකභාවයෙන් ඉහළ ප්‍රාථමික සහ ද්විතියික අධ්‍යාපනය සඳහා යොමු කිරීම.**

මෙම ගෝලීය අරමුණට ලගා වීම සඳහා ආයතනය විසින් සැලසුම් කළ ඉලක්ක අතරින් පළමු ඉලක්කය වන ප්‍රාථමික ශ්‍රේණි අවසානයේ, කියවීම හා ගණිතමය කුසලතා අවම මට්ටමක සහිත ගැහැණු සහ පිරිමි ළමුන්ගේ ප්‍රතිශතය අවම මට්ටමකට ගෙන ඒම. (5 ශ්‍රේණි ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 100 ට වැඩි අගයක් ගන්නා සිසු ප්‍රතිශතය) මේ සඳහා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කලාප අධ්‍යාපන කාර්යාල හා එක්ව ප්‍රාථමික අධ්‍යාපනයේ නිරත ගුරුභවතුන් හා සිසුන් ඉලක්ක කර ගනිමින් වැඩසටහන්, පෙරහුරු පරීක්ෂණ, ප්‍රාථමික විෂයය නිළධාරීන් සඳහා වූ වැඩසටහන් සැලසුම් කර තිබිණි. නව තත්වය යටතේ හඳුනාගත් අවශ්‍යතා මත දුරස්ථ ඉගෙනුම් උපක්‍රම යොදා ගනිමින් ප්‍රාථමික සිසුන්ගේ සාධන මට්ටම ඉහළ නැංවීම සඳහා වැඩසටහන් දියත් කරන ලදී. ( සිදු කරන ලද වැඩසටහන් 8.1 යටතේ ඇතුලත් කර ඇත) එසේම ගුරුභවතුන් සඳහා ද මාර්ගගතව හා භෞතික වශයෙන් නව තත්වය යටතේ අවශ්‍යතා හඳුනාගනිමින් වැඩසටහන් සිදු කරන ලදී. මෙහිදී ඉලක්කය සපුරා ගැනීමේ කාර්යය සාධනය 96%කි. කාර්යය සාධනය සපුරා ගැනීම 61% වූ අතර 2023 වර්ෂයේ 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයෙන් උතුරු මැද පළාත දිවයිනෙන් 6 වෙනි ස්ථානය ලබා ගන්නා ලදි.

දෙවන ඉලක්කය වශයෙන් ද්විතියික ශ්‍රේණි අවසානයේ කියවීම, අවම මට්ටමක සහිත පිරිමි හා ගැහැණු ළමුන්ගේ ප්‍රතිශතය අවම මට්ටමකට ගෙන ඒම 87 % (අ.පො.ස. සා/පෙළ සිංහල සමත් ප්‍රතිශතය) දක්වා ඉහල නැංවීම හඳුනාගන්නා ලදී. 2022 වර්ෂයේ අ.පො.ස.(සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල අනුව සිංහල විෂයය සමත් ප්‍රතිශතය 86.5% කි. එසේම තෙවන ඉලක්කය වශයෙන් ද්විතියික ශ්‍රේණි අවසානයේ ගණිතමය කුසලතා අවම මට්ටමක සහිත පිරිමි හා ගැහැණු ළමුන්ගේ ප්‍රතිශතය (අ.පො.ස. - සා.පෙළ ගණිත විෂයයට සාමාන්‍ය සාමාර්ථ ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය) 73% දක්වා ඉහළ නැංවීම හඳුනාගන්නා ලදී. 2022 වර්ෂයේ අ.පො.ස.(සා.පෙළ) ප්‍රතිඵල අනුව ගණිතය විෂයය සමත් ප්‍රතිශතය 68.5%කි. එම ඉලක්කය සාධනය කර ගැනීම 100% කින් සපුරා ගැනීමට නොහැකි වුවද, 2022 වර්ෂයට සාපේක්ෂව 1%ක වර්ධනයක් අත්පත්කර ගෙන ඇත. මෙම ජයග්‍රහණ ලබා ගැනීම සඳහා කලාප හා පළාත් ඒකාබද්ධව සැලසුම් කළ ක්‍රියාකාරකම් ඒ අයුරින්ම පැවැති ගෝලීය වසංගත තත්වය යටතේ කළ නොහැකි වූ නමුත් මාර්ගගතව හා දුරස්ථව කළ හැකි ක්‍රියාකාරකම් හඳුනාගෙන ක්‍රියාත්මක කරන ලදී.

**සියලුම කාන්තාවන්ට හා පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහළ සහ දැරියහැකි විශ්ව විද්‍යාල අධ්‍යාපනය ද ඇතුළත් තාක්ෂණික, වෘත්තීය සහ තෘතීයික අධ්‍යාපනය සඳහා සමාන ප්‍රවේශයක් සහතික කිරීම.**

මේ සඳහා ආයතනික වශයෙන් හඳුනාගන්නා ලද ඉලක්ක -

අ.පො.ස.(උසස් පෙළ) විද්‍යාව හා තාක්ෂණවේදය විෂය ධාරාව සඳහා සහභාගීත්වය ඉහළ නැංවීම - 34% දක්වා

අ.පො.ස.(උසස් පෙළ) වාණිජ විෂය ධාරාව සඳහා සහභාගීත්වය ඉහළ නැංවීම - 24% දක්වා

අ.පො.ස.(උසස් පෙළ) කලා විෂය ධාරාව සඳහා සහභාගීත්වය අඩු කිරීම - 42% දක්වා

13න් වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන ක්‍රියාත්මක කිරීම - 35% දක්වා

පාසල් හැරයන්නන් සඳහා නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම -18% දක්වා

උසස් පෙළ විද්‍යා විෂයය ධාරාව හා තාක්ෂණවේදය විෂයයධාරාව සහභාගිත්ව අනුපාතය උතුරු මැද පළාත තුළ 24% ක අගයක් ගනී. ඉලක්කය සාධනය කර ගැනීම 75% කි. මෙම කාර්යය සාධනය අත්පත් කර ගැනීම සඳහා , විද්‍යාව , ගණිතය, තොරතුරු තාක්ෂණය විෂයය ඉලක්ක කරගත් ගුරු/ සිසු වැඩසටහන්, අ.පො.ස.(සා.පෙළ) ප්‍රතිඵල ගුණාත්මකව ඉහළ දැමීමේ වැඩසටහන්, උසස් පෙළ විද්‍යාව විෂයය ධාරාවේ ප්‍රතිඵල ඉහළ නැංවීමේ ගුරු/ සිසු වැඩසටහන්, උසස් පෙළ තාක්ෂණවේදය විෂයය ප්‍රතිඵල ඉහළ නැංවීමේ ගුරු / සිසු වැඩසටහන් 2023 වර්ෂය සඳහා හඳුනාගෙන තිබිණි. ඒ යටතේ සැලසුම් කළ ක්‍රියාකාරකම් පැවැති තත්වය යටතේ ඒ අයුරින්ම ක්‍රියාත්මක කළ නොහැකි වුවත් පැවැති තත්වය යටතේ මාර්ගගතව හා දුරස්ථව කළ හැකි ක්‍රියාකාරකම් හඳුනාගෙන ක්‍රියාත්මක කරන ලදී. අ.පො.ස. (උසස් පෙළ) වාණිජ විෂය ධාරාව සඳහා සහභාගීත්වය ඉහළ නැංවීම 35% දක්වා ඉහළ නැංවීමේ ඉලක්කය සපුරා ගැනීම 40% කි. එනම් වාණිජ විෂයය ශිෂ්‍ය සහභාගිත්ව අනුපාතය 11% කි. තෙවන ඉලක්කය අ.පො.ස.(උසස් පෙළ) කලා විෂය ධාරාව සඳහා සහභාගීත්වය 25% දක්වා අඩු කිරිම. උතුරු මැද පළාත තුල මෙම සහභාගිත්ව අනුපාතය 51% කි. කලා විෂයය ධාරාව ශිෂ්‍ය සහභාගිත්ව අඩු කිරිම සඳහා අනෙකුත් විෂයය ධාරාවන්හි සහභාගිත්වය වැඩි කිරීම ඉලක්ක කරගත් වැඩසටහන් සැලසුම් කළ අතර පැවැති තත්වය යටතේ සිදු කළ හැකි ක්‍රියාකාරකම් හඳුනාගෙන ක්‍රියාත්මක කරන ලදී.

**අභිමානවත් රැකියාවන් සහ ව්‍යවසායකත්වයක් සඳහා තාක්ෂණික හා වෘත්තීය සුදුසුකම් වලින් යුත් අවශ්‍ය කුසලතා ලබා සිටින තරුණයින් සහ වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමකින් ඉහළ නැංවීම.**

මෙම ඉලක්කය සපුරා ගැනීම සඳහා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කුසලතාවයෙන් යුත් සිසුන් ප්‍රමාණය වර්ධනය කිරීම හඳුනාගෙන ඇත. 10-11 ශ්‍රේණි සිසුන් - 13589 දක්වා හා 12-13 ශ්‍රේණි සිසුන් - 4604 දක්වා හඳුනාගෙන ඇත. ඒ අනුව 6 -9 ශ්‍රේණිවල සියළුම සිසුන් සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය ඉගැන්වීම සිදු කරයි. එසේම 9 ශ්‍රේණියේ දී විෂයය හඳුන්වා දීමේ වැඩසටහන් තුලින් 10 හා 11 ශ්‍රේණිවල දී තොරතුරු තාක්ෂණ විෂයය හදාරණ සිසුන් සංඛ්‍යාව ඉහළ දැමීම සඳහා වැඩසටහන් සැලසුම් කර ඇත. 11 ශ්‍රේණියේ අ.පො. (සා.පෙළ) තොරතුරු තාක්ෂණ විෂයය ප්‍රතිඵල ඉහළ නැංවීම තුලින් උසස් පෙළ සඳහා තොරතුරු තාක්ෂණ විෂයය හදාරණ ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ නැංවීම සඳහා කටයුතු කර ඇත. උතුරු මැද පළාත තුල අ.පො.ස.(සා.පෙළ) විභාගය සඳහා තොරතුරු තාක්ෂණ විෂයය හදාරණ ශිෂ්‍ය ප්‍රතිශතය 31% කි. කාර්යය සාධනය අත්පත් කර ගැනීම 57% කි.

**අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පවත්නා වෙනස්කම් තුරන් කිරීම සහ ආබාධිත පුද්ගලයින්, ආදිවාසීන් සහ අවදානමට ලක්විය හැකි අවස්ථාවන්හි සිටින ළමුන් ඇතුළු අවදානම් සහිත පුද්ගලයින් සඳහා සියළු මට්ටමේ අධ්‍යාපනය සහ වෘත්තීය පුහුණුව සඳහා සමාන ප්‍රවේශයක් සහතික කිරීම.**

මේ සඳහා විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන් හඳුනාගෙන විශේෂ අධ්‍යාපන ඒකකවලට යොමු කිරීම එම ගුරුවරු පුහුණු කිරීම, විශේෂ අවශ්‍යතා ඇති සිසුන්ගේ කුසලතා සංවර්ධනය සඳහා වැඩසටහන් දියත් කෙරේ. සියලු පාසල්වල පෝෂණ වැඩසටහන ක්‍රියාත්මකවන අතර (උදෑසන ආහාරය ලබා දීම) ප්‍රතිපාදන අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ලබාදේ. ඊට අමතරව සිසුන්ගේ සෞඛ්‍ය හා පෝෂණ තත්ත්ව වැඩි දියුණු කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සෞඛ්‍ය කඳවුරු පවත්වනු ලබයි. ඊට අමතරව වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් දියත් කරයි. මේ සඳහා 2023 වර්ෂය සඳහා වූ වාර්ෂික සැලැස්මේ සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කළ අතර පාසල් පැවැත්වූ දින වලදී පාසල් 695ක පෝෂණ වැඩසටහන ක්‍රියාත්මක වූ අතර උපදේශනය සඳහා උපදේශනාත්මක වීඩියෝ පට සකස් කර බෙදා හරින ලදී. නමුත් විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සඳහා මාර්ගගත වැඩසටහන් උචිත නොවන බැවින් එම වැඩසටහන් පැවැති තත්වය යටතේ ක්‍රියාත්මක කළ නොහැකි විය.

**සියලු ම තරුණයින් හා කාන්තා හා පිරිමි වැඩිහිටි පුද්ගලයින්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් අකුරු හැකියාව සහ ගණන් කිරීමේ හැකියාව අත් කර ගන්නා බවට සහතික වීම.**

මෙහි දර්ශකය වන්නේ යම් වයස් කාණ්ඩයකට අදාළ අවම සාක්ෂරතා හා සංඛ්‍යාමය කාර්ය කුසලතාවයක් අත්කරගෙන සිටින සංඛ්‍යාව වේ. ඒ අනුව සිංහල හා ගණිත විෂයය සංවර්ධනය සඳහා ගුරු හා සිසු නිපුණතා සංවර්ධන වැඩසටහන් හඳුනාගන්නා ලද අතර පැවැති තත්ත්වය යටතේ මාර්ගගත දුරස්ථ අධ්‍යාපන වැඩසටහන් හඳුනාගෙන ක්‍රියාත්මක කරන ලදී.

**තිරසර සංවර්ධනය සහ තිරසර ජීවන රටාවන්, මානව හිමිකම්, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, සාමය හා අවිහිංසාවාදී සංස්කෘතිය, ගෝලීය පුරවැසිභාවය සහ සංස්කෘතික විවිධත්වය අගය කිරීම හා තිරසර සංවර්ධනය සඳහා සංස්කෘතියේ දායකත්වය ප්‍රවර්ධනය කිරීම.**

මේ යටතේ ගෝලීය පුරවැසිභාවය පිළිබඳ ඉගෙනුම ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා මානව හිමිකම් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති හා විෂය මාලා , ගුරු අධ්‍යාපනය හා ශිෂ්‍ය ඇගයීම් යන සියලු මට්ටම්වල තිරසර සංවර්ධනය සඳහා වන ඉගෙනුම යන දර්ශකය ළඟා කර ගැනීම සඳහා සියලුම විෂයයන්වල සංවර්ධනය උදෙසා ගුරු සිසු නිපුණතා සංවර්ධන වැඩසටහන් දියත් කර ඇත. ශිෂ්‍ය ඇගයීම් සඳහා පාසල් මට්ටමින් පාසල් පාදක තක්සේරුකරණය සහ වාර විභාග පැවැත්වේ මේ සඳහා ගුණාත්මක ප්‍රශ්න පත්‍ර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් සපයනු ලබයි.

**ළමයින්, ආබාධිතභාවය සහ ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ සැලකිලිමත් වන අධ්‍යාපන පහසුකම් සහ සැමට ආරක්ෂිත, අවිහිංසාවාදී, ඵලදායි ඉගෙනුම් පරිසරයක් ගොඩනැගීම.**

මෙහි ඵලදායි ඉගෙනුම් පරිසරයක් ගොඩ නැඟිම සඳහා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් කලාප අධ්‍යාපන කාර්යාල හා ඒකාබද්ධව සියලුම පාසල් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් හඳුන්වාදෙන ලද ප්‍රමිති පදනම් කරගෙන බාහිර මාර්ගෝපදේශ වැඩසටහන ක්‍රියාත්මක කර ප්‍රගති සමාලෝචන හා වාර්තා

පාසල්වලට ලබාදී අවශ්‍ය ප්‍රතිපෝෂණ සිදුකරයි. මේ සඳහා ප්‍රතිපාදන වැය කිරීමක් නොමැති අතර සියලු පාසල්වල සිසුන් ප්‍රතිලාභීන් වේ.

**සංවර්ධනය වෙමින් පවතින, විශේෂයෙන්ම අවම වශයෙන් සංවර්ධිත රටවල හා කුඩා දූපත් ප්‍රාන්තවල ගුරු පුහුණුව සඳහා ජාත්‍යාන්තර සහයෝගීතාව ලබාගෙන සුදුසුකම්ලත් ගුරුවරුන්ගේ සැපයුම සැලකිය යුතු ලෙස වැඩිකිරීම.**

පළාත් සභා හා රේඛීය අමාත්‍යාංශයේ අදාළ වැය විෂය ඔස්සේ ලද ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් පාසල් හා අධ්‍යාපන ආයතනවල නව ඉදිකිරීම්, අලුත්වැඩියා සහ මිලදී ගැනීම් කටයුතු අදාල චක්‍රලේඛ ප්‍රකාරව සිදුකරන ලදී.

පාසල්වල ව්‍යුහාත්මක වෙනස්කම් සඳහා අධ්‍යාපන කලාපයේ නිර්දේශ සහිතව ලද ඉල්ලීම්, අදාල චක්‍රලේඛයට අනුකූලව සිදු කළ හැකි අවස්ථාවල අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියට යටත්ව ඉටු කරන ලදී.

මෙහිදි පාසල් මට්ටමින් ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා පාසල් පාදක වෘත්තිය ගුරු සංවර්ධන වැඩසටහන් සියලු පාසල්වල ක්‍රියාත්මක කෙරේ. මේ පිළිබඳව පළාතේ සියලුම විදුහල්පතිවරු , සියලුම නිලධාරින් හා ගුරුවරුන් දැනුවත් කිරීම් සිදු කර ඇත. ඒ අනුව පාසල් පාදකව ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධන අවශ්‍යතා හඳුනාගෙන අවශ්‍ය ගුරු සංවර්ධනය පාසල් මට්ටමෙන් සිදු කරනු ලබයි.

**තිරසර සංවර්ධන අරමුණු වලට අදාල කාර්යය සාධනය උපයා ගැනීමේ දී ආයතනය සතු වූ ශක්තීන් හා අවස්ථා -**

- කාර්යය සඳහා කැපවූ කාර්යය මණ්ඩලය.
- නිසි මගපෙන්වීමක් සහිත නායකත්වය.
- වෙනස් වීම් සඳහා ක්ෂණිකව ප්‍රතිචාර දක්වන අධ්‍යයන කාර්යය මණ්ඩල.
- නව දැක්මක් හා වෙනස් වීම් සඳහා ප්‍රතිචාර දක්වන ලද විදුහල්පතිවරුන්, ගුරු උපදේශකවරුන්, ගුරුභවතුන්.
- අපේක්ෂා සහිත දෙමාපියන්.
- සහය දැක්වීම හා මග පෙන්වීම සඳහා කැපවූ පළාත් සභික ආයතන හා ප්‍රධානීන්.
- පහසුකම් හා මග පෙන්වීම සඳහා කැපවූ රේඛීය ආමාත්‍යාංශය හා රාජ්‍ය අමාත්‍යාංශය.
- පහසුකම් සැපයීම සඳහා අනුග්‍රහය දැක්වූ පෞද්ගලික ආයතන.
- ලෝක බැංකු ණය ආධාර යටතේ ක්‍රියාත්මක වූ වැඩසටහන් සඳහා ලැබුනු ප්‍රතිපාදන.

**තිරසර සංවර්ධන අරමුණු වලට අදාල කාර්යය සාධනය උපයා ගැනීමට ඇති වූ තර්ජන -**

- රටේ උද්ගතවූ වසංගත තත්වයේ පශ්චාත් බලපෑම් හේතු කොට අධ්‍යාපන පද්ධතියට ඇති වූ බලපෑමෙන් 2023 වර්ෂයේ ද පාසල් අධ්‍යයන වාරවල ඇති වූ වෙනස්කම් හේතුවෙන් වර්ෂය සඳහා නියමිත දින ගණන පාසල් නොපැවැත්වීම.
- රටතුල උද්ගත වූ ආර්ථික අර්බුදය.
- ප්‍රමුඛ කාර්යක් ලෙස පාසල් වාර තුන සඳහාම ප්‍රශ්නපත්‍ර මුද්‍රණය සිදු කිරීම සඳහා වියදම් ඉහළ ගිය බැවින් ගුරු හා සිසු වැඩසටහන් සඳහා වියදම් සීමා කිරීමට සිදුවීම.
- මාර්ගගත වැඩසටහන් සිදු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුමෙහි ගැටළු සහිත ගුරුභවතුන්.
- සංඥා පහසුකම්වල දුර්වලතා.
- සිසුන් සඳහා උපකරණවල හිඟය.

- දෙපාර්තමේන්තු හා කලාප මට්ටමින් ද මාර්ගගත ඉගැන්වීම සඳහා අවශ්‍ය උපකරණවල හිඟතාවය.
- විශේෂ අධ්‍යාපන සිසුන් සඳහා දුරස්ථ අධ්‍යාපන උපක්‍රම නොගැලපීම.
- නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන් හරහා ලබා දෙන වෘත්තීය පුහුණුව මාර්ගගතව ලබා දීමේ ගැටළු.
- තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක සාධනය කිරීම පළාත් හා ප්‍රාදේශීය මට්ටමින් ගලපා ගැනීමේදී ඇති වන්නා වූ ගැටළු.

**ප්‍රාථමික සිසුන් වෙනුවෙන් සකස්කර ලබා දුන් දුරස්ථ ඉගෙනුම් මෙවලම් කිහිපයක්**

ඉංග්‍රීසි කියවීම් කඳවුරු පැවැත්වීම -






ද්විතියික අධ්‍යාපන සිසුන් සඳහා ලබා දුන් ගණිත ඉගෙනුම් මෙවලම් පරිහරණය කළ අවස්ථා කිහිපයක් -







විශිෂ්ඨ ව්‍යවහාර කෘතිය එළි දැක්වීම.




පාසල් බාහිර මාර්ගෝපදේශන සඳහා නව නිර්ණායක සහිත ඇගයීමේ ක්‍රමවේද සහිත කෘතිය නිර්මාණය කිරීම.



**නිළධාරින්ගේ ධාරිතා සංවර්ධන වැඩ සටහන් (ගුරු විදුහල්පති ඇගයිමේ ජයග්‍රාහී පාසල් සඳහා ක්ෂේත්‍ර චාරිකාවක් සංවිධානය කිරීම.)**





**<u>පංති කාමර ගොඩනැගිලි අලුත්වැඩියාව</u>**



**උමැප/අනු/අනු/නාච්/මහනෙළුබැව ප්‍රා.විද්‍යාලය 60*20 පංති කාමර ගොඩනැගිල්ල අලුත්වැඩියාව**



**උමැප/අනු/අනු/නැනු/කිරික්කුලම ප්‍රා.වි. 130*20 පංති කාමර ගොඩනැගිල්ල අලුත්වැඩියාව**



**උමැප/අනු/කැකි/කැකි/ මුරුංගංහිටිකන්ද වි.100*20 පංති කාමර ගොඩනැගිල්ලේ වහලය අලුත්වැඩියාව**



**උමැප/අනු/කැකි/පලා/ පලාගල ම.වි. 80*20 පංති කාමර ගොඩනැගිල්ල අලුත්වැඩියාව**



උමැප/අනු/කැබි/මැද/ අල් අක්ෂා මු.වි (මහ සියඹලාගස්කඩ) **80*20** පංති කාමර ගොඩනැගිල්ල අලුත්වැඩියාව



උමැප/අනු/කැබි/මැද/ ඇතාකඩ ම.වි. 60*20 පංති කාමර ගොඩනැගිල්ල අලුත්වැඩියාව



උමැප/පො/දිඹු/අරල/ අලවාකුඹුර ම.වි. 40*20 පංති කාමර ගොඩනැගිල්ල අලුත්වැඩියාව



උමැප/පො/හිඟු/ඇළ/ ගල්මුල්ල ක.වි. 60*20 පංති කාමර ගොඩනැගිල්ල අලුත්වැඩියාව

## <u>ගුරු නිවාස අලුත්වැඩියාව</u>



උමැප/අනු/අනු/විල/ දූනුමඩලාව වි. ගුරු නිවාසය අලුත්වැඩියාව



උමැප/අනු/තඹු/ගල්/ පහල කලංකුට්ටිය ප්‍රා.වි. ගුරු නිවාසය අලුත්වැඩියාව

**පරිච්ඡේදය - 06**

## 6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු /(අතිරික්ත) |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 29 | 23 | 6 |
| තෘතීයික | 2 | 2 | - |
| ද්විතික | 95 | 82 | 13 |
| ප්‍රාථමික | 35 | 15 | 20 |

## 6.2. ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති අන්දම

- අපේක්ෂිත නිමැවුම් ප්‍රමාණය අපේක්ෂිත කාලරාමුව තුල සිදු කිරීමට නොහැකි වීම
- කාර්යක්ෂමතාව අඩුවීම
- නිමැවුම්වල ප්‍රමිතිය අඩුවීම
- ඵලදායිතාවය අඩුවීම
- එක් නිලධාරියෙකුට පැවරී ඇති රාජකාරි ප්‍රමාණය වැඩිවීම හේතුවෙන් සේවක තෘප්තිමත්භාවය හීනවීම.

## 6.3. මානව සම්පත් සංවර්ධනය - 2023

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව (දින/මාස/ අවුරුදු) | සමස්ත ආයෝජනය (Rs'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම / ලබාගත් දැනුම * |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| *බාහිර අධීක්ෂණයෙන් ප්‍රාථමික අංශයේ අරමුණු සක්ෂාත් කර ගැනීම පිළිබඳ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන. (පළාත්) | 345 | එක් දින | 0.21 | - | දේශීය | බාහිර අධීක්ෂණය පිළිබඳව දැණුවත වීම. |
| * ප්‍රාථමික අධ්‍යාපනයේ සංකල්ප හා ක්‍රමවේද පිළිබඳව සහ අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා හා තක්සේරුකරණය පිළිබඳව විදුහල්පතිවරුන් හා අංශ ප්‍රධානීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 08ක් සංවිධානය කිරීම (GEMP). | 1352 | තෙදින | - | 0.37 | දේශීය | සංකල්ප, ක්‍රමවේද පිළිබඳව සහ අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා හා තක්සේරුකරණය පිළිබඳව දැනුවත් වීම. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| * ප්‍රාථමික ගුරුභවතුන්ගේ ගණිතය විෂයානුබද්ධ ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම / ප්‍රාථමික ඉගෙනුම් උපකරණ කට්ටල සකස් කිරිම (GEMP). | 1128 | තෙදින | - | 1.41 | දේශීය | ගණිතය විෂයානුබද්ධ ධාරිතා සංවර්ධනය. |
| * 2022 දී පවත්වන ලද ගුරු අනාවරණ පරීක්ෂණ ප්‍රතිඵල විශ්ලේෂණයට අනුව 2022 වර්ෂය තුළ පුහුණු වීමට අවස්ථාව නොලැබුණු පාසල් 410 ක ගණිත පත්වීම් ලද ගුරුවරුන් 500ක් සඳහා විෂය ආශ්‍රිත ගුරු පුහුණු ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම (GEMP). | 1219 | දෙදින | - | 0.83 | දේශීය | විෂය ආශ්‍රිත ගුරු පුහුණුව ලබා ගැනීම. |
| * භෞතික විද්‍යා ගුරු භවතුන් 30ක් සඳහා ඉලෙක්ට්‍රොනික් විද්‍යාව සම්බන්ධ ප්‍රායෝගික වැඩමුළුව. | 26 | දෙදින | 0.12 | - | දේශීය | ඉලෙක්ට්‍රොනික් විද්‍යාව සම්බන්ධ ප්‍රායෝගික දැනුම ලබා ගැනීම. |
| * ගුරු සංවර්ධනය, ගුරු අධ්‍යාපනය හා ගුරු කළමනාකරණ වැඩසටහන් - ගුරු සංවර්ධන වැඩසටහන් (ද්විතියික). | 1289 | දෙදින | 0.73 | - | දේශීය | ගුරු සංවර්ධනය, අධ්‍යාපනය හා කළමනාකරණය පිළිබඳ දැනුම ලබා ගැනීම. |
| * සාමාන්‍ය ඉංග්‍රිසි විෂය උගන්වන ගුරුභවතුන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන. | 6 | දෙදින | 0.04 | - | දේශීය | සාමාන්‍ය ඉංග්‍රිසි විෂය ආශ්‍රිත ධාරිතා සංවර්ධනය |
| * ඉංග්‍රිසි උගන්වන ගුරුවරුන් පුහුණු කිරිමේ වැඩසටහන. | 18 | දෙදින | 0.05 | - | දේශීය | ඉංග්‍රීසි ගුරු පුහුණුව |
| * විදුහල්පතිවරුන් දැනුවත් කිරිමේ වැඩසටහන. | 120 | දෙදින | 0.04 | - | දේශීය | විෂයානුබද්ධ දැනුවත්භාවය වැඩි වීම. |
| * 2022 අ.පො.ස. (සා/පෙළ) විභාගය සඳහා පෙනීසිටි සිසුන්ගේ දෙමාපියන් 13 වසරක අධ්‍යාපන වැඩ සටහන පිළිබඳව දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම. | 256 | එක්දින | 0.07 | - | දේශීය | වැඩ සටහන පිළිබඳව දෙමාපියන්ගේ දැනුවත්භාවය. |
| * අනුරාධපුර දිස්ත්‍රික්කයේ විශේෂ අධ්‍යාපන ගුරුවරුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩමුළුව. | 23 | දෙදින | 0.7 | - | දේශීය | ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය. |
| * වෘත්තිය සංක්‍රමණ අවස්ථා සැලසුම් කිරිම සහ විශේෂ අධ්‍යාපන ගුරුවරුන් සහ ගුරු උපදේශකවරුන්ගේ විශේෂ අධ්‍යාපන ප්‍රවණතා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව. | 46 | දෙදින | 0.2 | - | දේශීය | විශේෂ අධ්‍යාපන ප්‍රවණතා පිළිබඳ දැනුවත්භාවය වැඩි වීම. |
| * පාඨමාලා උපදේශකවරුන් සඳහා වු කුසලතා සංවර්ධන වැඩසටහන. | 40 | එක්දින | 0.04 | - | දේශීය | කුසලතා සංවර්ධනය ලබා දීම. |
| * කලාප මට්ටමින් උපදේශන ගුරුභවතුන්ගේ උපදේශන කුසලතා සංවර්ධන පුහුණු වැඩසටහන් (GEMP). | 650 | එක්දින | - | 0.57 | දේශීය | උපදේශන කුසලතා සංවර්ධනය ලබා දීම. |
| * සති පාසල වැඩසටහන පිළිබඳ නිලධාරින්, විදුහල්පතිවරුන්, ගුරුභවතුන් පුහුණු කිරීම (GEMP). | 261 | එක්දින | - | 0.32 | දේශීය | සති පාසල වැඩසටහන පිළිබඳව දැනුවත්භාවය ඇති කිරීම. |
| * අ.පො.ස (උ.පෙළ) ගිණුම්කරණය දෙදින නේවාසික ගුරු පුහුනු වැඩසටහන. | 166 | දෙදින | 0.34 | - | දේශීය | පුහුණුව ලබාදීම. |
| * අධ්‍යාපනවේදී නවක උපාධිධාරි ගුරුවරුන් දිශාභිමුඛ කිරිමේ වැඩසටහන. | 84 | සතිය | 0.07 | - | දේශීය | පුහුණුව ලබාදීම හා දැනුවත් කිරීම. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| * විදුහල්පතිවරු දැනුවත් කිරිම හා අනිවාර්ය අධ්‍යාපන කමිටු යාවත්කාලීන කිරිම. | 278 | දෙදින | 0.36 | | දේශීය | දැනුවත් කිරිම. |
| * iTESL මොඩියුල 1 සහ 2 සඳහා දින 3ක ගුරු පුහුණුව සහ ITALAS සවන්දීමේ කථන සංවර්ධනය සහ තෝරාගත් ගුරුවරුන් සඳහා දින 3 වැඩමුළුව (GEMP). | 406 | තෙදින | - | 0.92 | දේශීය | පුහුණුව ලබාදීම හා දැනුවත් කිරිම. |
| * (සිංහල / දෙමළ) අ.පො.ස (සා.පෙළ) වාණිජ ගුරුවරුන් සඳහා ප්‍රශ්න පත්‍ර සැකසීම පිළිබඳ දෙදින පුහුණු වැඩමුළුවක් පැවැත්වීම (SESIP). | 55 | දෙදින | - | 0.07 | දේශීය | ප්‍රශ්න පත්‍ර සැකසීම පිළිබඳ |
| * අධ්‍යාපන සාමාන්‍ය සහතික සා/පෙළ වාණිජ විෂයයන් සම්බන්ධ ගුරුවරුන්ගේ දැනුම යාවත්කාලීන කිරීම සඳහා දෙදින ධාරිතා සංවර්ධන වැඩමුළු පැවැත්වීම (SESIP). | 92 | දෙදින | - | 0.18 | දේශීය | පුහුණුව ලබාදීම හා දැනුවත් කිරිම. |
| * ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම . | 64 | දෙදින | 0.08 | - | දේශීය | ධාරිතා සංවර්ධනය කිරීම |
| * මානව සම්පත් සංවර්ධන වැඩසටහන් පැවැත්වීම. | 80 | දෙදින | 0.60 | - | දේශීය | මානව සම්පත් සංවර්ධනය |
| * පාසල් මට්ටමින් පාසල් පාදක වෘත්තීය ගුරු සංවර්ධන වැඩසටහන් සැලැස්ම සකස් කිරිම සඳහා පාදක තොරතුරු හඳුනා ගැනිම , විදුහල්පතිවරුන්ගේ වැඩසටහන භාර ගුරුභවතුන්ගේ දැනුම යාවත්කාලීන කිරිමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරිම (GEMP). | 565 | දෙදින | - | 0.37 | දේශීය | විදුහල්පතිවරුන්ගේ, වැඩසටහන භාර ගුරුභවතුන්ගේ දැනුම යාවත්කාලීන කිරිම. |
| * 2024 නිපුනතා රාමුව - විදුහල්පති වරුන් සඳහා පුහුණු වැඩසටහන | 132 | සතිය | 1.17 | - | දේශීය | විදුහල්පතිවරුන්ගේ ධාරිතා සංවර්ධනය |
| **එකතුව** | **8701** | | **4.82** | **5.04** | | |

ඉහත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුලින් ගුරු, විදුහල්පති ධාරිතා සංවර්ධනය සේම සිසු පුහුණු වැඩසටහන් තුලින් දෙපාර්තමේන්තුව ඍජුව හා වක්‍රව අපේක්ෂා කරනු ලැබුවේ සිසුන්ගේ ඉගෙනුම්ඵල වඩවඩාත් සංවර්ධනය කිරීම වන අතර ගුරුවරුන්ගේ හා විදුහල්පතිවරුන්ගේ ධාරිතාවන් හා දැනුම සංවර්ධනය තුලින් පාසල්වල මනා කළමණාකාරීත්වය සේම කාර්යක්ෂම හා ඵලදායී පාසල් පරිපාලනය ඇති කිරීම සඳහා මෙම වැඩසටහන් හේතු පාදක විය.

**පරිච්ඡේදය - 07**

**අනුකූලතා වාර්තාව**

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ / ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1.** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කර තිබේද?** | | | |
| 1.1. | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිශ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අනුකූල නොවේ | අදාල නොවේ | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අනුකූල නොවේ | අදාල නොවේ | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අනුකූල නොවේ | අදාල නොවේ | |
| 1.6 | වෙනත් ගිණුම් | අනුකූල නොවේ | අදාල නොවේ | |
| | | | | |
| **2.** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (ප.මු.රී.321)** | | | |
| 2.1 | පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛය 2014/14 හා 2016/10 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කරගෙන පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ පිළියෙල කර නියමිත දිනට පළාත් භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | | |
| 2.6. | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | පවත්වාගෙන යාම | | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| | | | | |
| **3.** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයයන් අභිනියෝජනය කිරීම (ප.මූ.රී.83)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනයතුළ පවරා දී තිබීම. | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම. | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහි සිදුවන පරිදි බලතල පවරා දී තිබීම. | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුමු චක්‍රෙල්ඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 3.5 | රාජ්‍ය ගිනුම් දෙපාර්තමේන්තුව විසින් 2022.11.23 දිනැතිව නිකුත් කර ඇති අංක 4/2022 චක්‍රෙල්ඛය හා 2023.01.05 දිනැතිව පළාත් භාණ්ඩාගාරය විසින් නිකුත් කර ඇති NCP/CS/PT/ICTO/GPS දරණ ලිපියට අනුව GPS මෘදුකාංගය හරහා වැටුප් සකස් කිරීම | අනුකූල වේ | | |
| | | | | |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | නියමිත දිනට වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | නියමිත දිනට වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | නියමිත දිනට වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 4.4 | නියමිත දිනට වාර්ෂික ඇස්තමේන්තුව සකස් කර අයවැය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | නියමිත දිනට වාර්ෂික අග්‍රිම සීමා වාර්තාව පළාත් භාණ්ඩාගාර ගිනුම් හා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| | | | | |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දීම | අනුකූල වේ | | |
| | | | | |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | DMA චක්‍රලේඛය 1-2019 අනුව වසර ආරම්භයේදී අභ්‍යන්තර විගණන සැලසුම් සකස් කිරීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| | | | | |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛය 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක්වත් අදාළ වර්ෂයතුළ පවත්වා තිබීම | අනුකූල වේ | | |
| | | | | |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | පළාත් සභාව සතු වත්කම් කළමනාකරණය සම්බන්ධව පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 2014/14 හා 2016/10 අනුව වත්කම් මිලදී ගැනීම, නිකුත් කිරීම හා අපහරණය කිරීම පිළිබඳ කටයුතු කිරිම. | අනුකූල වේ | | |
| 8.2 | කොන්ට්‍රොල ජනරාල්ගේ අංක 1/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 13 වන | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොන්ට්‍රෝල ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | | | |
| 8.3 | පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛයේ අංක 2022/08 අනුව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්තය, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කර තිබීම. | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම ප.මූ.රී.490 අනුව සිදු කිරීම. | අනුකූල වේ | | |
| 8.6 | කොන්ට්‍රෝල ජනරාල්ගේ 2022.09.09 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 10/2022 ප්‍රකාරව ආයතනයේ එකතු වී ඇති අබලි ද්‍රව්‍ය බැහැර කර තිබීම. | අනුකූල වේ | | |
| | | | | |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අනුකූල නොවේ | වාහනවල අයිතිය වෙනත් දෙපාර්තමේන්තු සතු වීම | වාහනවල අයිතිය නිසි පරිදි පවරා ගැනීමට කටයුතු කිරීම |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වාගනිමින් ඒවා යාවත්කාලීන කර | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | පවත්වාගෙන යාම | | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම ප.මු.රී.54 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | ප්‍රධාන ලේකම්ගේ NCP/CP/FD/08 හා 2017.08.08 දිනැති ලිපිය ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව බදු වාහන ලොග්පොත්වල සම්පූර්ණ අයිතය පවරාගෙන තිබීම. | අනුකූල නොවේ | මෙම දෙපාර්තමේන්තුව සතුව කල්බදු වාහන නොමැත | |
| | | | | |
| **10.** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැළපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් පළාත් මූල්‍ය රීතී ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| | | | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම. | අනුකූල වේ | | |
| 11.2 | ප.මු.රී.46 ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොයික්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| | | | | |
| **12** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම. | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | | | |
| | | | | |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කිරීම | අනුකූල වේ | | |
| 13.2 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.572 අනුව කටයුතු කිරීම. | අනුකූල වේ | | |
| | | | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | ප.මු.රී.25990 සමාලෝචිත වර්ෂ අවසානයේදී මුදල් පොතේ ශේෂය පළාත් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | ප.මු.රී.261 ප්‍රකාව නිකුත් කළ තත්කාර්යය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී සතියක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| 14.3 | ප.මු.රී.261 ප්‍රකාව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත් කාර්යය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම. | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| | | | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | ප.මු.රී.133ට අනුකූලව රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් කොට තිබීම | අනුකූල නොවේ | අදාල නොවේ | |
| 15.2 | රැස්කළ තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකර රැස් කරනු ලබන අවස්ථාවේම සෘජුවම ආදායමට බැර කර තිබීම. | අනුකූල නොවේ | අදාල නොවේ | |
| 15.3 | ප.මු.රී.116ට අනුව හිඟ ආදයම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල නොවේ | අදාල නොවේ | |
| | | | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්යය මණ්ඩල සීමාව තුළ පවත්වාගෙන යාම හා වැටුප් ගෙවීම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම. | | | |
| 16.3 | 2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 4/2017 ප්‍රකාරව සියලු වාර්තා කළමනකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| | | | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කර තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 17.2 | ආයතනයේ පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රසංශා/ චෝදනා පළකිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල නොවේ | වෙබ් අඩවියෙහි ප්‍රශංසා හා චෝදනා පල කිරීමට පහසුකම් සලසා නොමැති අතර විද්‍යුත් තැපැලට යොමු කිරීම සඳහා පහසුකම් සලසා ඇත | අදාළ පහසුකම් ඇති කිරීම සඳහා කටයුතු කරමින් ඇත |
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 08වන හා 10වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම. | | | |
| | | | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2018 හා අංක 05/2018 (i) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම. | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම | අනුකූල වේ | | |
| | | | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කර තිබීම | | | |
| 19.2 | කාර්යය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කර තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යය සාධන ගිවිසුම අත්සන් කර තිබීම | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදයේ ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම. | අනුකූල වේ | | |
| | | | | |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කර තිබීම | අනුකූල වේ | | |